# වාර්ෂික වාර්තාව
# 2015

## ජාතික අධ්‍යාපන ආයතනය
## මහරගම

# ප්‍රගති වාර්තාව - 2015

## 1.0 හැඳින්වීම

1985 අංක 28 දරණ පාර්ලිමේන්තු පනත මගින් දූයේ දරුවනට ගුණාත්මක අධ්‍යාපනයක් උරුම කර දීම සඳහා ඉවහල් වන පහත සඳහන් අරමුණු ඉටුකරලීමේ බලය ජාතික අධ්‍යාපන ආයතනයට පවරා ඇත.

(අ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා වූ සැලසුම්, වැඩ සටහන් සහ ක්‍රියාකාරකම් පිළිබඳව විෂයභාර අමාත්‍යවරයාට උපදෙස් දීම;

(ආ) අධ්‍යාපනය හා අදාළ විශේෂිත ක්ෂේත්‍ර සඳහා පශ්චාත් උපාධි අධ්‍යාපනය සැලසීම හා ඒවා ප්‍රවර්ධනය කිරීම.

(ඇ) අධ්‍යාපන පද්ධතියෙහි කාර්ය සාධනය, අරමුණු, ව්‍යුහ, අන්තර්ගතය සහ විධි ක්‍රම ද ඇතුළුව අධ්‍යාපන ක්‍රමය පිළිබඳව සහ අධ්‍යාපනයේ සමාජ, ආර්ථික සහ වෙනත් අංශ අනාවරණය කර ගැනීම සඳහා අධ්‍යයන පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඈ) අධ්‍යාපනික කාර්ය සඳහා තාක්ෂණික ඥානය අනුවර්තනය කිරීම ද ඇතුළුව අධ්‍යාපන පද්ධතියේ නවීකරණ ක්‍රියාවලි ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඉ) අධ්‍යාපන පද්ධතියෙහි නියැළි කාර්ය මණ්ඩලවල වෘත්තීය සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඊ) රජයට සහ වෙනත් අනුමත සංවිධාන සඳහා අධ්‍යාපනය හා සම්බන්ධ විශේෂඥ සේවා ලබාදීම;

(උ) විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් අධ්‍යාපන සංවර්ධනය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ

(ඌ) සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමග සහයෝගීව කටයුතු කිරීම.

ඒ අනුව දේශීය හා ගෝලීය අවශ්‍යතාවලට සරිලන, සමාජ ආර්ථික සංදර්භයට උචිත, චිර භාවිත දේශිය දැනුම් හා උරුමයන් අගයන ඵලදායී පුරවැසියන් බිහි කිරීම සඳහා ඉවහල් වන විෂයමාලාවක් මගින් අධ්‍යාපනයේ ගුණාත්මක බව සහතික කිරීමේ ද, පාසල් පද්ධතියට අවශ්‍ය නිපුණතා පූර්ණ වෘත්තිකයන් පිරිසක් නිර්මාණය කරනු සඳහා නායකත්වය සැපයීමේ ද, අධ්‍යාපන සංවර්ධනය ඉලක්ක කර ගත් ප්‍රතිපත්ති සම්පාදනය සුසාධ්‍ය කිරීමට හා ඊට මග පෙන්වනු පිණිස විද්‍යාත්මක විධි ක්‍රම ඔස්සේ තහවුරු කරගත් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමේ ද වගකීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරී ඇත.

කාලයේ වේගය ඉක්මවා විවිධ ඉගෙනුම් කේෂ්ත්‍ර තුළට එකතුවන නව දැනුම ජාතියේ දරුවනට උරුම කර දීම සඳහා ශ්‍රී ලංකාවේ දූනට ක්‍රියාත්මක විෂයමාලා ප්‍රතිපත්තියට අනුව සෑම අවුරුදු 8කට වරක් ම විෂයමාලා නවීකරණ ක්‍රියාවලියක් සිදු කෙරේ. ඒ අනුව පසුගිය විෂයමාලා සංවර්ධන ක්‍රියාවලිය 2005 වර්ෂයෙන් ආරම්භ වී 2010 වසරේ දී සාර්ථකව නිම කරන ලදී. පාසල් විෂයමාලාව අරභයා 2012 වසරේ දී තබන ලද ස්ථාවර පදනම මත පිහිටා 2015 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජිත නව විෂයමාලාව සඳහා පවත්නා විෂයමාලාව විචාරවත් විෂයමාලාවක් බවට පත් කිරීමේ කටයුතු 2012

වසරේ දී ආරම්භ කරන ලදි. පවත්නා විෂයමාලාව යථාර්තවත් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් පාදක කරගනු ලැබුවේ පහත සඳහන් අංශ විෂයාලාව හා බද්ධ කිරීම සඳහාය.

1. විෂයමාලාව පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වීම පිළිබඳව ඒ ඒ විෂය කංඩායම් මගින් ක්‍රියාත්මක කරන ලද අධ්‍යයන වලින් අනාවරණය වු කරුණු;

2. විෂයමාලාව පිළිබඳව විවිධ සමාජ කණ්ඩායම් මගින් පෙන්වා දෙන ලද ධනාත්මක අදහස් හා යෝජනා;

3. විෂයමාලා සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව ලෝකයේ විවිධ රටවල්වල සාර්ථක අත්දැකීම්;

4. ඒ ඒ විෂය ක්ෂේත්‍රවලට එක්වූ නව දැනුම් හා ඉගෙනුම් ක්‍රමවේද;

යථාර්ථවත් විෂයමාලාව 6,10 ශ්‍රේණිවල ක්‍රියාත්මක කිරීම හා ක්‍රියාත්මක වීම අධික්ෂණය කිරීම සහ විෂයමාලාවේ ඊ ළඟ අදියර 1,7,11 ශ්‍රේණි සඳහා 2016 වසරේ දී හඳුන්වාදීම සඳහා ගුරු අත්පොත් සකස් කිරීම සහ පළාත් ගුරු උපදේශකවරුන් පුහුණු කිරීම සඳහාත් 2017 වසරේ දී 2,8,12 ශ්‍රේණිවලට යථාර්ථවත් විෂයමාලාව හඳුන්වාදීමට සඳහා විෂය නිර්දේශ සකස් කිරීම සඳහාත්ය.

අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන හඳුන්වා දීමෙන් අනතුරුව විෂයමාලා සංවර්ධනය හා සම්බන්ධ කටයුතු සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ප්‍රධාන වශයෙන් ආවරණය කර ගන්නා ලද්දේ වර්තමානයේ දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP /DFAT) යනුවෙන් හැඳින්වෙන අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන (ESDFP)හා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) හා ආසියානු සංවර්ධන බැංකු (ADB)ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (ESDP) යන මූල්‍ය ප්‍රවාහ යටතේය.

පවත්නා මුදල් අවහිරතා නිසා මහා භාණ්ඩාගාරය මගින් ආයතනයට ලබාදෙනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය පුද්ගල පඩිනඩිවලට වැය වූ පසු ජලය,විදුලිය,පවිත්‍රතා හා ආරක්ෂක වැය ශීර්ෂ පියවාගැනීමට හෝ ප්‍රමාණවත් නොවන තත්වයක් තුළ ආයතනයේ වැය පියවාගනු ලබන්නේ ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ පාඨමාලාවලින් ලැබෙන ආදායම් උපයෝගි කර ගනිමිනි. එසේ වුව ද ආයතනය මගින් විශේෂිත ක්ෂේත්‍ර යටතේ පවත්වනු ලබන පාඨමාලා හුදෙක් ලාබ ඉපයීමේ පරමාර්ථයෙන් ක්‍රියාත්මක කරනු ලබන ඒවා නොවන බැවින් ඒ සඳහා අයකරනු ලබන්නේ වෙනත් ආයතන මගින් සමාන පාඨමාලා සඳහා අයකරන මුදල හා සැසඳීමේ දී අඩු මුදලකි.

පහත වගුව 2015 වර්ෂයේ ආයතනයේ ආදායම් වියදම් පිළිබඳ තොරතුරු සපයයි.

| මූල්‍ය ප්‍රභවය | පුනරාවර්තන වියදම් | | ප්‍රාග්ධන වියදම් | |
|---|---|---|---|---|
| | සංශෝධිත ප්‍රතිපාදනය | සත්‍ය වියදම | සංශෝධිත ප්‍රතිපාදනය | සත්‍ය වියදම |
| ඒකාබද්ධ අරමුදල (CF) | 338,000,000 | 337,710,405 | 282,000,000 | 57,729,712 |
| දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසල් අධ්‍යාපනය ප්‍රතිනිර්මාණය කිරීම පිළිබඳ ව්‍යාපෘතිය (TSEP) | 30,000,000 | 28,114,054 | 14,000,000 | 12,457,393 |
| ඔස්ට්‍රේලියානු රජයේ ප්‍රතිපාදන (DFAT) | 22,500,000 | 22,105,730 | 14,500,000 | 13,754,323 |
| ආයතනයේ ආදායම් (Income) | 123,016,000 | 112,841,719 | 5,000,000 | 4,609,475 |
| අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩ සටහන (ESDP) | 49,100,000 | 49,039,623 | 900,000 | |
| එක්සත් ජාතීන්ගේ ළමා සංවර්ධන අරමුදල (UNICEF) | 2,790,000 | 2,225,746 | - | |
| ශ්‍රී ලංකාවේ කොරියානු තනාපති කාර්යාලය | 338,000 | 112,950 | - | |
| යුනෙස්කෝව සඳහා වූ කොරියානු ජාතික කොමිසම | 2,500,000 | 2,454,555 | - | |
| **එකතුව** | **568,244,000** | **554,604,782** | **316,400,000** | **88,550,903** |

2015 වර්ෂය ආරම්භයේ දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලන තන්ත්‍රයේ සිදු වූ වෙනස්කම් සමඟ 2015 වර්ෂයේ අප්‍රේල් මාසයේ සිට ආයතනය ජාතික මට්ටමේ දී මෙන්ම අන්තර්ජාතිකව ද සම්භාවනාවට පත්වූ අධ්‍යක්ෂ ජනරාල් වරයකුගේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක විය. ඒ සමඟම ආයතනයේ කාර්ය වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස පද්ධතියට ගෙනයාම සඳහාත් ජාතික ආයතනයක් ලෙස පැවතීම සඳහා සපුරාගත යුතු මානව හා භෞතික සම්පත් වර්ධනය කර ගැනීම සඳහාත් ආයතනයේ පරිසරය හා වටපිටාව ඊට උචිත අයුරින් වැඩි දියුණු කර ගැනීම සඳහාත් ඉවහල් වන ක්‍රියාමාර්ග රැසක් ආරම්භ කරන ලදී. එහෙත් ආයතනික මට්ටමින් විසදා ගත නොහැකි වූ පහත සඳහන් මූලික හේතු සාධකවල බලපෑම මත 2015 වර්ෂයේ දී යම් යම් පසුබෑම්වලට මුහුණ දීමට ද ආයතනයට සිදුවිය.

- පාර්ලිමේන්තු පනත මගින් ආයතනයට පැවරී ඇති කාර්ය ඉටුකිරීමේ දී ආයතනයට ලබාදීමට එකඟවූ ප්‍රතිපාදන ප්‍රමාණය නියමිත පරිදි නොලැබීම එක් පැත්තකින් නියමිත ඉලක්ක කරා ළඟා වීමට ප්‍රධාන බාධකයක් වූ අතර, කාර්ය මණ්ඩල හිගය විශේෂයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හිඟකම.

- ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ තනරතුරක සිටි අයෙකු විශ්‍රාම ගිය අවස්ථාවක දී එම පුරප්පාඩුව පිරවීම සඳහා වුව ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගතයුතු වීම.
- ආයතනයේ පවත්නා වැටුප් පිරිවැය ආකර්ෂණීය නොවීම හේතුවෙන් නියමිත සුදුසුකම් හා අත්දැකීම් සහිත පුද්ගලයන් තනතුරු සඳහා ඉදිරිපත් නොවීම වැනි හේතු නිසා අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු විශාල සංඛ්‍යාවක් පුරප්පාඩුව පැවතීම.

පාර්ලිමේන්තු පනත මගින් ආයතනයට පැවරී ඇති කාර්ය නියමිත පරිදි ඉටුකිරීම සඳහා ආයතනයේ දැනට සිටින කාර්ය මණ්ඩලය විවිධ අපහසුතා මධ්‍යයේ වුව ද දැඩි කැපකිරීමක් සිදු කළ අතර, එම අපහසුතාව සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලද්දේ කාර්යමණ්ඩල හිගයයි. 2015 වර්ෂය ආරම්භ වන අවස්ථාව වනවිට 652ක් වූ අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 188ක් පැවතුණි. පහත සඳහන් වගුව 2014 වසර ආරම්භ වනවිට ආයතනයේ පැවති කාර්යමණ්ඩල තත්ත්වය පිළිබඳව පැහැදිලි චිත්‍රයක් ලබාදෙයි.

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය (01.01.2015 දිනට) | පවත්නා කාර්ය මණ්ඩලය (01.01.2015 දිනට) | | | පුරප්පාඩු සංඛ්‍යාව (01.01.2015 දිනට) |
|---|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | එකතුව | |
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | 00 | 01 | 00 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 | 00 | 00 | 00 | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 06 | 02 | 01 | 03 | 03 |
| අධ්‍යක්ෂ | 27 | 11 | 06 | 17 | 10 |
| සභා ලේකම් (අධ්‍යාපන) | 01 | 00 | 00 | 00 | 01 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය /ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ | 72 | 25 | 13 | 38 | 34 |
| කථිකාචාර්ය / අධ්‍යාපනඥ | 75 | 23 | 25 | 48 | 27 |
| සහකාර කථිකාචාර්ය / සහකාර අධ්‍යාපනඥ | 90 | 21 | 29 | 50 | 40 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 379 | 144 | 163 | 307 | 72 |
| **එකතුව** | **652** | **227** | **237** | **464** | **188** |

ආයතනයේ සිටි පළපුරුදු කාර්යමණ්ඩල සමාජිකයන් 08 දෙනෙකු විශ්‍රාම යාමත් පවත්නා පුරප්පාඩු සඳහා සේවක මණ්ඩලය බඳවා ගැනීම දැඩි ලෙස සීමා කිරීමත් කාර්ය මණ්ඩල හිඟය වැඩිවීමට හේතු වූ අතර, ආයතනයේ නිමැවුම්වල ගුණාත්මකභාවයට ද එයින් යම් බලපෑමක් ඇති වූ බව ද සඳහන් කළ යුතුය. පවත්නා සේවක මණ්ඩලයේ දැඩි කැපවීම මත එම තත්ත්වය අවම කර ගනිමින් 2015 වසරේ දී යථෝක්ත ප්‍රගතිය අත්කර ගැනීමට ආයතනයට හැකිවිය.

ඉහත කරුණුවලට අමතරව 2015 අප්‍රේල් මාසයේ දී ආයතනය සඳහා නව අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් වවූ ද ආයතනය සඳහා පාලක මණ්ඩලයක් පත් කිරීම සඳහා යම් කාලයක් ගතවීම නිසා ගුරු අත්පොත් සහ වෙනත් විෂයමාලා ද්‍රව්‍ය කිපයක් සඳහා ආයතන සභාවේ අනුමැතිය ලබා ගැනීමට නොහැකිවීමෙන් නියමිත වේලාවට පාසල් පද්ධතියට ලබා දීමට නොහැකි විය.

කෙසේ වුව ද, ඉහත සඳහන් පසුබැම් යටතේ පවා ආයතනයේ කටයුතු හැකි උපරිම අයුරින් නියමිත කාලය තුළ දී ම ඉටුකිරීමට ආයතනයේ කාර්ය මණ්ඩලය කටයුතු කර ඇත. 2015 වර්ෂයේ දී දේශීය මෙන්ම විදේශීය ගුරුවරුන්, විදුහල්පතිවරුන් හා අධ්‍යාපන පරිපාලකයින් ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයේ 9500 කට ආසන්න පිරිසක් ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා සඳහා සහභාගි වී ඇත.

## 2.0 ජාතික අධ්‍යාපන ආයතන සංවිධාන ව්‍යුහය

### 2.1 ආයතන සභාව - 2015

ජාතික අධ්‍යාපන ආයතන පනත මගින් එහි ආයතන සභාව වෙත පහත සඳහන් බලතල පැවරී ඇත:

- ව්‍යවස්ථාවෙන් නියම කරන ලද බඳවා ගැනීමේ පටිපාටි හා පත් කිරීම් සම්බන්ධ ක්‍රියා පිළිවෙලට අනුව ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම;
- ආයතනයේ කාර්ය මණ්ඩලයේ සේවා සම්බන්ධ නියමයන් සහ කොන්දේසි, වැටුප්, වේතන හා අනෙකුත් පාරිතෝෂික ඇතුළු කාර්ය මණ්ඩල සේවා ගෙවීම් සම්බන්ධ නීති රීති තීරණය කිරීම;
- ආයතනයේ විනය සම්බන්ධ නීති රීති සම්පාදනය කිරීම;
- ආයතන කාර්ය මණ්ඩලයට ප්‍රතිලාභ ලැබෙන පරිදි හා අර්ථ සාධක සහ සුභසාධක වැනි අරමුදල් ස්ථාපිත කිරීම හා විධිමත් කිරීම.

ජාතික අධ්‍යාපන ආයතන පනතට අනුව ආයතනය සම්බන්ධ මූල්‍ය හා පරිපාලන බලතල පැවරී ඇත්තේ ආයතන සභාවට ය. 2015 වසරේ ආයතන සභාව පහත සඳහන් සාමාජික සාමාජිකාවන්ගෙන් සමන්විත විය.

| | | |
|---|---|---|
| *උපාලි මාරසිංහ මහතා<br>(ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය)* | - | *සභාපති (2015.08.07 දක්වා)* |
| *ඩබ්.එම්. බන්දුසේන මහතා<br>(ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය)* | - | *සභාපති (2015.09.11 සිට)* |
| *මහාචාර්ය ගුණපාල නානායක්කාර මහතා<br>(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)* | - | *සාමාජික (2015.04.02 සිට)* |
| *මහාචාර්ය එස්.සන්දරසේගරම් මහතා<br>(හිටපු පීඨාධිපති, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය)* | - | *සාමාජික* |
| *ආචාර්ය ටී.ඒ. පියසිරි මහතා<br>(උප කුලපති, වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය)* | - | *සාමාජික* |
| *වයි.එල්.එම්. නවාවි මහතා<br>(ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යංශය)* | - | *සාමාජික* |
| *කේ.එ.එච්.සි. පුබුදුසිරි මහත්මිය<br>(සහකාර අධ්‍යක්ෂක, ජාතික අයවැය දෙපාර්තමේන්තුව)* | - | *සාමාජික* |
| *මහාචාර්ය ඩබ්.ඩී.ඩබ්. ජයතිලක මහතා<br>(මහාචාර්ය, රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ජයවර්ධනපුර)* | - | *සාමාජික* |
| *ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි මහතා<br>(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය)* | - | *සාමාජික* |
| *මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතා<br>(සමාජ විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය)* | - | *සාමාජික* |
| *වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා<br>(අධ්‍යක්ෂ, සෞඛ්‍ය අධ්‍යාපන හා ප්‍රකාශන කාර්යාංශය)* | - | *සාමාජික* |
| *මානික්‍යා කොඩිතුවක්කු මහත්මිය<br>(කථිකාචාර්ය, භාෂා දෙපාර්තමේන්තුව, විවෘත විශ්ව විද්‍යාලය)* | - | *සාමාජික* |
| *වී.සි.ඩී.පී.පෙරේරා මිය<br>(අධ්‍යක්ෂ, බාහිර සම්පත් කළමනාකරණ ඒකකය, ජා.අ.ආ)* | - | *ආයතන සභා ලේකම්* |

## 2.2 ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය 2015

ආයතන සභාවට අමතර ව ආයතනයේ සියලු ම ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධයෙන් උපදෙස් දීමට අධ්‍යාපන, කළමනාකරණ, පරිපාලන හා වෙනත් ක්ෂේත්‍රවල ප්‍රවීණත්වයක් ඇති විද්වතුන්ගෙන් සමන්විත ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයක් පත් වන අතර, එමගින් ආයතනයේ පහත දැක්වෙන ශාස්ත්‍රීය කාර්ය හා සම්බන්ධයෙන් අධ්‍යාපනික නායකත්වය, සුපරීක්ෂණය සහ උපදේශනය ලබා දෙයි.

- සියලු ම ශාස්ත්‍රීය කාර්යවල දී ආයතන සභාවට උපදෙස් සැපයීම;
- ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධ ව ආයතන සභාව විසින් පවරන ලද කටයුතු සම්බන්ධයෙන් කරුණු සමාලෝචනය කොට වාර්තා කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා, පුහුණු වැඩසටහන් සහ විභාග පිළිබඳ නිර්දේශ ආයතන සභාවට ඉදිරිපත් කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යාපන පාඨමාලා, පුහුණු වැඩසටහන් හා විභාග සඳහා සිසුන් බඳවා ගැනීම පිළිබඳ නිර්දේශ ආයතන සභාවට ඉදිරිපත් කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා, පුහුණු වැඩසටහන් හෝ විභාග වලට අදාළ නීති රීති සම්පාදනය කිරීම හා ඒවා ආයතන සභාවට ඉදිරිපත් කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග පරීක්ෂකවරුන් වශයෙන් පත් කිරීමට සුදුසු අයගේ නම් ආයතන සභාවට නිර්දේශ කිරීම;
- ආයතන සභාව මගින් අනුමත කොන්දේසි සම්පූර්ණ කරන ලද පුද්ගලයන් සඳහා ශිෂ්‍යත්ව, පදක්කම් සහ ත්‍යාග ප්‍රදානය කිරීම හා
- ආයතන සභාවේ අනුමැතිය ඇතිව විවිධ කමිටු සඳහා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඇතුළත් වන අය මෙන්ම ඉන් පරිබාහිර පුද්ගලයන් පත් කිරීම;

2015 වසරේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය සමන්විත වූයේ පහත දැක්වෙන විද්වතුන්ගෙනි.

| | | |
|---|---|---|
| *මහාචාර්ය ඩබ්ලිව්. ආරියදාස ද සිල්වා මහතා (හිටපු පීඨාධිපති, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය)* | - | *සභාපති (2015.03.03 දක්වා)* |
| *ආචාර්ය එම්.ඒ. උපාලි මාම්පිටිය මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගණිත දෙපාර්තමේන්තුව, කැලණිය විශ්ව විද්‍යාලය)* | - | *සභාපති (2015.07.21 සිට)* |
| *මහාචාර්ය ඩබ්ලිව්.එම්.අබේරත්න බණ්ඩාර මහතා (අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)* | - | *සාමාජික (2015.01.06 දක්වා)* |

*එස්.යූ. විජේරත්න මහතා - සාමාජික (2015.04.03 දින පමණි)*
*(වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)*
*මහාචාර්ය ගුණපාල නානායක්කාර මහතා - සාමාජික (2015.04.02 සිට)*
*(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)*
*මහාචාර්ය නාරද වර්ණසූරිය මහතා - සාමාජික (2015.03.03 දක්වා)*
*(හිටපු උපකුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)*
*ආර්.එස්.මැදගම මහතා - සාමාජික (2015.03.03 දක්වා)*
*(විශ්‍රාමික අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ක්‍රියාත්මක කිරීමේ ඒකකය)*
*ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්ප කුමාර මහතා - සාමාජික*
*(විභාග කොමසාරිස් ජනරාල්, විභාග දොපර්තමේන්තුව)*
*වී. මුතුකුමාරස්වාමි මහතා - සාමාජික*
*(හිටපු විදුහල්පති, හින්දු විද්‍යාලය කොළඹ 04)*
*තිස්ස හේවාවිතාරණ මහතා - සාමාජික*
*(කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව)*
*මහාචාර්ය සුදන්ත ලියනගේ - සාමාජික (2014.10.30 දක්වා)*
*(පීඨාධිපති, ව්‍යවහාරික විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)*
*එල්.එම්.ඩී. ධර්මසේන මහතා - සාමාජික*
*(විද්‍යා පීඨ කොමසාරිස්, අධ්‍යාපන අමාත්‍යංශය)*
*ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර - සාමාජික*
*(ලේකම්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව)*
*ඊ.කේ. ගණිහිගම මහතා - සාමාජික (2015.07.21 සිට)*
*(සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය )*
*ආචාර්ය ආර්. යූ. හල්වතුර මහතා - සාමාජික (2015.07.21 සිට)*
*(සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, මොරටුව විශ්ව විද්‍යාලය)*
*මහාචාර්ය පී.සී.පී. ජවුෆර් මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, - සාමාජික (2015.03.03 දක්වා)*
*(විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය, ජා.අ.ආ.)*
*ආචාර්ය මහීම් මෙන්ඩිස් මහතා - සාමාජික (2015.07.21 සිට)*
*(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව විවෘත විශ්ව විද්‍යාලය)*
*මහාචාර්ය ආර්. අරංගල මහතා*
*(මහාචාර්ය, සිංහල දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය) - සාමාජික (2015.0721 සිට)*
*ආචාර්ය ප්‍රසාද් විමලරත්න මහතා - සාමාජික (2015.07.21 සිට)*
*(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පරිගණක පාසල, කොළඹ විශ්ව විද්‍යාලය)*

| | | |
|---|---|---|
| *ආචාර්ය එම්.ටී.එම්. මහීස් මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්ව විද්‍යාලය)* | - | *සාමාජික* |
| *එස්.එෆ්.ඒස්.පී. ජයවර්ධන මහතා (නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, විද්‍යා හා තාක්ෂණ පීඨය, ජා.අ.ආ)* | - | *සාමාජික* |
| *පූජ්‍ය ආචාර්ය මාඹුල්ගොඩ සුමනරතන ස්වාමින් වහන්සේ (නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ජා.අ.ආ.)* | - | *සාමාජික* |
| *බී. සනත් පූජිත මහතා (නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, පර්යේෂණ හා සැලසුම් පීඨය ජා.අ.ආ)* | - | *සාමාජික* |
| *එන්.වී.ඒ.එස්. සමරසිංහ මහතා (වැඩ බලන, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය, ජා.අ.ආ.)* | - | *සාමාජික (2015.07.30 සිට)* |
| *වී.සී.ඩී.පී. පෙරේරා මිය (අධ්‍යක්ෂ, බාහිර සම්පත් කළමනාකරණ ඒකකය, ජා.අ.ආ)* | - | *ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල ලේකම්* |

### 2.3 අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

අධ්‍යයන සභාවේ සහ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ උපදේශනය හා අධීක්ෂණය යටතේ ජාතික අධ්‍යාපන ආයතනය පැවරුණු කටයුතු පහත සඳහන් සංවිධාන ව්‍යුහයට අනුව ක්‍රියාත්මක කරන ලදි.

අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය, විභාග දෙපාර්තමේන්තුව, බාහිර සම්පත් කළමනාකරණ ඒකකය හා අභ්‍යන්තර විගණන අංශය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය මගින් 2015 වසරේ දී ආයතන සභා රැස්වීම් 13ක් ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල රැස්වීම් 16ක් පවත්වා තිබේ.

2015 වසරේ දී ද ආයතනයේ අභ්‍යන්තර පරිපාලන ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය මගින් කාර්යක්ෂම විගණන සේවාවක් පවත්වා ගෙන යන ලදී.

ආයතන නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ඉවහල් වන විවිධ පාඨමාලා සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට අවස්ථා සලසා දීම බාහිර සබඳතා ඒකකයේ ප්‍රධාන වගකීම වේ. බාහිර සබඳතා ඒකකය මගින් 2015 වර්ෂය තුළ දී පහත සඳහන් කාර්ය ඉටු කරන ලදී.

- බාහිර සම්පත් කළමනාකරණ ඒකකය මගින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව, 2015 ජනවාරි - දෙසැම්බර් කාලය තුළ ආයතනයේ නිලධාරීන් 17 දෙනෙකු සඳහා විදේශ වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගීවීමට අවස්ථා සම්පාදනය කිරීම.

- ජාතික අධ්‍යාපන ආයතනය සහ මැලේසියාවේ මලයා විශ්ව විද්‍යාලය අතර අත්සන් කළ අවබෝධතා ගිවිසුම අනුව ආයතනයේ නිලධාරීන් 03 දෙනෙකු සඳහා පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවස්ථාව ලබාදීම.

- ලෝක බැංකුවේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රහය මත අධ්‍යයන නිලධාරීන් 10 දෙනෙකු සඳහා මැලේසියාවේ Science & Management විශ්වවිද්‍යාලයෙහි ආචාර්ය උපාධි හැදෑරීමට අවස්ථාව ලබාදීම.

## 2.4 පීඨ / අංශ

2015 වර්ෂයෙහි ආයතනයේ සංවිධාන ව්‍යුහය පහත සඳහන් එක් එක් පීඨ සහ අංශ යටතේ ක්‍රියාත්මක විය.

### 2.4.1 භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
දෙමළභාෂා දෙපාරතමේන්තුව
ඉංග්‍රීසි භාෂා දෙපාර්තමේන්තුව
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ආගම් දෙපාර්තමේන්තුව
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

### 2.4.2 විද්‍යා හා තාක්ෂණ පීඨය

විද්‍යා දෙපාර්තමේන්තුව
ගණිත දෙපාර්තමේන්තුව
තාක්ෂණික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
වාණිජ දෙපාර්තමේන්තුව
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව
සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන ඒකකය
මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව

### 2.4.3 පර්යේෂණ හා සැලසුම් පීඨය

සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව
පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව

**2.4.4 අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය**

වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ දෙපාර්තමේන්තුව

අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන දෙපාර්තමේන්තුව

විදේශීය පාඨමාලා ඒකකය

**2.4.5 විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය**

අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සම්භාව්‍ය, විදේශීය භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව

මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය

විවෘත පාසල් ඒකකය

ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව

**2.4.6 පරිපාලන, මූල්‍ය හා සහාය සේවා අංශය**

පරිපාලන හා මානව සම්පත් දෙපාර්තමේන්තුව

මුදල් දෙපාර්තමේන්තුව

ඉංජිනේරු හා නඩත්තු සේවා දෙපාර්තමේන්තුව

පුස්තකාල හා කෞතුකාගාර දෙපාර්තමේන්තුව

ප්‍රවාහන ඒකකය

**2015 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද විශේෂ කාර්ය**

විෂයමාලා සංවර්ධනය වෘත්තීය සංවර්ධනය, හා අධ්‍යාපන පර්යේෂණ යන ආයතනයට පැවරී ඇති ප්‍රමුඛ කාර්ය හා සම්බන්ධව 2015 වාර්ෂික සැලැස්මට ඇතුළත් කාර්ය හා සෘජුව සම්බන්ධ වූ මෙන්ම සෘජුව සම්බධව නොවූ පහත සඳහන් විශේෂ කාර්ය ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2015 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලදී.

- ලෝකය පුරා විවිධ රටවල අඩු පහසුකම් සහිත දරුවන්ගේ ඉගෙනුම් අවශ්‍යතා සපුරා දීම සඳහා කැප වී ක්‍රියාත්මකවන ආයතන අතරින් UNESCO King Sejong Literacy Prize ලබා දිම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ විවෘත පාසල් ඒකකය 2015 වසරේ දී දෙපාර්තමේන්තු තෝරාගනු ලැබීම.

- ජපන් රජය පරිත්‍යාග කළ ගොඩනැගිලි සංකීර්ණය තුළ ස්ථාපිත අවුරුදු 20කටත් වඩා පැරණි දේශනශාලා නවීන උපාංගයන්ගෙන් සහ උපකරණ වලින් සමන්විත දේශන ශාලා බවට පරිවර්තනය කිරීම.

- ආයතනයේ කම්කරු, කාර්යාල ආධාරක තනතුරු වලට බඳවා ගන්නා ලද සුදුසුකම් සහිත සේවකයන් ඉහළ තනතුරුවලට බඳවාගැනීමේ දී ඔවුන් සතුවිය යුතු නිපුණතා ඔවුන් හට ලබාදීම සඳහා කාර්යාල කළමනාකරණ කටයුතු හා සම්බන්ධ දේශන මාලාවක් ක්‍රියාත්මක කිරිම.
- ආයතනයේ කාර්ය මණ්ඩලයේ සුභසාධනය සඳහා වෛද්‍ය මධ්‍යස්ථානයක් විධිමත් ලෙස ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික පියවර ගැනිම.
- ආයතනයේ 2016-2020 සංයුක්ත සැලැස්ම සකස් කිරීම සඳහා අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ සියලු දෙනාගේ සංවර්ධනාත්මක අදහස් ලබා ගැනීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- ජර්මන් ජනරජයේ තාක්ෂණික සහයෝගතා (GIZ) ප්‍රතිපාදන යටතේ පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන දෙවන බස සිංහල / දෙමළ විෂයවල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පහසු කරලීම සඳහා ක්‍රියාකාරකම් ඇතුළත් ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන් සකස්කර පද්ධතියට ලබාදීම සහ නැටුම් පෙරදිග සංගීතය, චිත්‍ර, නාට්‍ය හා රංග කලාව යන සෞන්දර්ය විෂය ඉගැන්වීම් පහසුකරලීම සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් ඩී.වී.ඩී පට 15 ක් සකස් කර පද්ධතියට හඳුන්වා දීම.

## 3.0 විෂයමාලා සංවර්ධනය

ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සංවර්ධන කටයුතු ඉටු කරනු ලබන්නේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය සහ විද්‍යා හා තාක්ෂණ යන පීඨ මගිනි.
විෂයමාලා සම්පාදනය සඳහා ආයතනයට පැවරී ඇති බලතල යටතේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයට අයත් දොපර්තමේන්තු 7ක්, තාක්ෂණ පීඨයට අයත් දෙපාර්තමේන්තු 5ක් හා විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨයට අයත් සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව ද ඇතුළත්ව 2015 වර්ෂයේ දී විෂයමාලා සංවර්ධනය හා සම්බන්ධ ව්‍යාපෘති පනස් පහක් ක්‍රියාත්මක කරන ලදී. විෂයමාලා සංවර්ධන කාර්ය තුළින් පහත සඳහන් ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කළ අතර, යම් යම් බාධක මධ්‍යයේ වුව ද එම අපේක්ෂා වැඩි ප්‍රමාණයක් ලඟකාර ගැනීමට ජාතික අධ්‍යාපන ආයතනය සමත් වී ඇත.

- සමාජ, සංස්කෘතික, ආර්ථික සහ තාක්ෂණික අවශ්‍යතාවලට ගැළපෙන පරිදි විෂයමාලා සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, පුනරීක්ෂණ සහ සංශෝධන කටයුතු කිරීම.
- විෂයමාලා නවීකරණ හා සමග ම අර්ථවත් ප්‍රායෝගික ඉගෙනුම් උගැන්වීම් ක්‍රියාවලියක් සඳහා වන නව විධික්‍රම පාසල් පද්ධතියට හඳුන්වා දීම.

- විෂයමාලා සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීමේ කාර්යවල නියුක්ත පිරිස්වල වෘත්තීය නිපුණතා වැඩි දියුණු කිරීම.

- විෂයමාලා සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම යන ක්ෂේත්‍රවල තොරතුරු අනාවරණය කර ගැනීම සඳහාත් අධ්‍යාපනයේ ගුණාත්මක ප්‍රවර්ධනය සඳහාත් ඉවහල් වන පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීම.

- ඉගෙනුම් - උගැන්වීම් ක්‍රියාවලියේ හා ඇගයීම් ක්‍රියාමාර්ගවල සාර්ථකත්වය සඳහා නව විධික්‍රම හඳුන්වා දීම.

- ශිෂ්‍යයන්ගේ සන්නිවේදන, තොරතුරු තාක්ෂණ නිපුණතා සහ ජාතික හා ජාත්‍යන්තර භාෂා නිපුණතා සංවර්ධනය කිරීම.

- සංස්කෘතික හා ස්වාභාවික උරුමය රැක ගැනීමේ සහ ආරක්ෂා කර ගැනීමේ නිපුණතා සිසුන් තුළ ඇති කිරීම.

- සමාජයේ ජීවත් වන විවිධ ජන කණ්ඩායම්වලට ආවේණික ආගමික, සංස්කෘතික හා භාෂාමය වශයෙන් පවත්නා විවිධත්වය අගය කිරීමටත් ශ්‍රී ලාංකිකයන් ලෙස සැම දෙනාට ම එක් ව සිටීමටත් අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම.

**විෂයමාලා සංවර්ධනය වෙනුවෙන් 2015 වර්ෂයේ දී නිම කළ විෂයමාලා කාර්ය පහත දැක්වේ.**

- ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයේ 3,9 සහ 12/13 ශ්‍රේණි සඳහා විෂය නිර්දේශ 75ක් සහ 1,8 සහ 12 ශ්‍රේණි සඳහා ගුරු අත්පොත් 78ක් සකස් කිරීම.
- සෞන්දර්ය විෂය ධාරාවේ 7 ශ්‍රේණිය සිට 11 ශ්‍රේණිය දක්වා ක්‍රියාත්මක වන චිත්‍ර, භරත නාට්‍ය, කර්නාටක සංගීතය, පෙරදිග සංගීතය, බටහිර සංගීතය සහ නාට්‍ය හා රංග කලාව විෂය සඳහා අතිරේක විෂය සම්පත් පොත් 16ක් සැකසීම.
- අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ විද්‍යාව විෂයෙහි ශිෂ්‍ය සාධනය 2016 සහ 2017 වර්ෂවල ඉලක්කගත මට්ටමින් වර්ධනය කිරීම සඳහා වන ක්‍රියාකාරකම් ග්‍රන්ථයක් සැකසීම.
- 10 සහ 11 ශ්‍රේණිවල විද්‍යා විෂයය සඳහා සකස් කළ ප්‍රතිකාර්ය ඉගෙනුම් වැඩ සටහන ඇගයීම සඳහා ඇගයීම් උපකරණ සකස් කිරීම සහ ඇගයීම්කරුවන් 40 දෙනෙකු සඳහා පුහුණු සැසියක් ක්‍රියාත්මක කිරීම.
- 9,10 සහ 11 ශ්‍රේණිවල ගණිතය විෂය ඉගෙනුම් උගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීම සඳහා උපකාරක ප්‍රශ්න පත්‍ර කට්ටල 45ක් සකස් කිරීම.

- පූර්ව ළමා සංවර්ධන අධ්‍යාපනය සඳහා වයස අවුරුදු 3-5 දරුවන් සඳහා වූ ප්‍රමිති පාදක කරගත් විෂයමාලා රාමුවක් සකස් කිරීම.
- පළමු ශ්‍රේණියේ භාෂාව, ගණිතය සහ පරිසරය ආශ්‍රිත ක්‍රියාකරකම් යන විෂය විශේෂ අධ්‍යාපනය සඳහා ඒකාබද්ධ කිරීම සඳහා සකස් කළ ගුරු අත්පොත් වල අවසන් පිටපත සැකසීම.
- ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ සඳහා හඳුන්වා දීමට සැලසුම් කළ අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සඳහා විෂය නිර්දේශ 31ක් සැකසීම.

**යථාවත් කරන ලද විෂයමාලාව පිළිබඳව විෂය අධ්‍යක්ෂවරුන්, විදුහල්පතිවරුන්, ගුරු උපදේශකවරුන් හා ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.**

පවත්නා විෂයමාලා චක්‍රයට අනුව යථාවත් කරන ලද විෂයමාලාව පාසල් පද්ධතියේ 6 සහ 10 ශ්‍රේණි සඳහා ක්‍රියාත්මක කිරීම 2015 වසරේ ආරම්භ කිරීමට නියමිතව තිබූ අතර, ඒ සඳහා පළාත් විෂය අධ්‍යක්ෂවරුන්, විදුහල්පතිවරුන්, ගුරු උපදේශකවරුන් සහ ගුරුවරුන් දැනුවත් කිරීමේ කටයුතු 2015 සැප්තැම්බර් මාසය අවසන් වීමට පෙර නිම කිරීමට අවශ්‍ය වැඩකටයුතු සැලසුම් කර තිබුණි. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල ඉල්ලීම් මත ඊට පසුව ද යථෝක්ත වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා එම ආයතනවලට සහාය දැක්වීමට ද ජාතික අධ්‍යාපන ආයතනයට සිදුවිය. ඒ අනුව සියළුම පළාත් ඇතුළත් වන පරිදි පළාත් සහ කලාපවල විෂය අධ්‍යක්ෂවරුන්, විදුහල්පතිවරුන්, ගුරු උපදේශකවරුන් සහ ගුරුවරුන් 9500 දෙනෙකු දැනුවත් කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයට හැකිවිය.

## 5.0 අධ්‍යාපන නායකත්ව සංවර්ධනය හා වෘත්තීය සංවර්ධන අවස්ථා වැඩිදියුණු කිරීම

අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ගේ වෘත්තීය සංවර්ධනය වැඩිදියුණු කිරීම ආයතනයට පැවරී ඇති ප්‍රධාන කාර්යවලින් එකකි.

යථෝක්ත කාර්ය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන කළමනාකරණය සහ පාසල් පරිපාලනය හා සම්බන්ධව අධ්‍යාපන විද්‍යාපති කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාවේ සිට අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව දක්වා පරාසයක පැතිරුණු පාඨමාලා රැසක් ජාතික අධ්‍යාපන ආයතනයේ මීපේ පරිශ්‍රයෙහි දී ක්‍රියාත්මක කරන ලදී.

ඊට අමතරව, පද්ධතියෙහි සිටින අධ්‍යාපන පරිපාලන සේවයට අයත් නිළධාරින් සඳහා කෙටිකාලීන පුහුණු පාඨමාලා සහ අධ්‍යාපන පරිපාලන සේවයට බඳවාගත් නවක නිලධාරින් සඳහා විශේෂ වශයෙන් සකස් කළ දිගුකාලීන ප්‍රේරණ පාඨමාලා ක්‍රියාත්මක කිරීම ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් සිදු කරනු ලැබේ.

අධ්‍යාපන කළමනාකරණය හා සම්බන්ධ තෝරාගත් සුවිශේෂී තේමා පාදක ගනිමින් ඒ පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබාදීම සඳහාත්, අධ්‍යාපන කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණය

යොදාගැනීම පිළිබඳ තේමා පාඨමාලා ක්‍රියාත්මක කිරිමද අධ්‍යාපන නායකත්ව සංවර්ධන පීඨය යටතේ සිදුවන අතර, ඒ හා සම්බන්ධ පාඨමාලා රැසක් 2015 වසර තුළ දී ක්‍රියාත්මක කරන ලදී. ද්විතීයික පාසල් දහසක් සංවර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ එම පාසල්වල විදුහල්පතිරුන් සහ නියෝජ්‍ය විදුහල්පතිවරුන් පුහුණුකිරිමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වසරේ දී ප්‍රමුඛතාව දුන් අතර, පහත සඳහන් වගුව අධ්‍යාපන කළමනාකරණ සංවර්ධන පීඨය 2015 වසරේ දී පවත්වන ලද පාඨමාලා පිළිබඳ තොරතුරු ගෙනහැර දක්වයි.

**01 වන වගුව වෘත්තීය සංවර්ධන පාඨමාලා පිළිබඳ විස්තර 2015**

| පාඨමාලාව | වගකීම දරන දෙපාර්තමේන්තුව | පාඨමාලාව පැවැත්වෙන ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| **පශ්චාත් උපාධි පාඨමාලා**<br>අධ්‍යාපන කළමනාකරණ විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව | වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 50 |
| **පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා**<br>පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා (පූර්ණකාලීන යන අර්ධකාලීන පාඨමාලාව | වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 397 |
| **ඩිප්ලෝමා පාඨමාලා**<br>පාසල් කළමනාකාරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 213 |
| **කෙටිකාලීන පාඨමාලා**<br>අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ කෙටිකාලීන තේමා පාඨමාලාව | වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 1244 |
| විදුහල්පති පාඨමාලාව | වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 420 |
| **විදේශීය සිසුන් සඳහා වන පාඨමාලා**<br>අධ්‍යාපනපති කළමනාකරණ පාඨමාලාව | වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 23 |
| අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව | වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 33 |

## 6.0 ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

අධ්‍යාපන පද්ධතියෙහි නියැළි වෘත්තිකයින් සඳහා ඔවුන්ගේ වෘත්තිය සංවර්ධන අවශ්‍යතා පාදක කරගනිමින් විශාල පරිමාණයෙන් විවිධ ගුරු කංඩායම් සඳහා නවීකරණ හා ක්‍රම හඳුන්වාදීමේ දීර්ඝකාලක අත්දැකීම් රාශියක් ජාතික අධ්‍යාපන ආයතනය ලබා ගෙන ඇත. පද්ධතියට හඳුන්වා දෙනු ලබන විෂයමාලා සංවර්ධන හෝ වෙනත් ඕනෑම සංවර්ධනාත්මක කාර්යයක සාර්ථකත්වය රඳා පවතින්නේ ඒවා ක්‍රියාත්මක කරනු ලබන ගුරුවරුන් සතුව ඒ පිළිබඳව මනා අවබෝධයක් දැනුවත් බවත් ඇත්නම් පමණි. ඔවුන් ඵලදායී ක්‍රියාකාරීන් කිරීම සඳහා ඉවහල් වන අධ්‍යාපන දර්ශනපති පාඨමාලාවේ සිට සහතික පත්‍ර පාඨමාලා දක්වා පැතිරුණ පාඨමාලා රැසක් ගුරු අධ්‍යාපනය හා සම්බන්ධ දෙපාර්තමේන්තු සහ විෂයමාලා සංවර්ධන දෙපාර්තමේන්තු කීපයක් විසින් දිවයින පුරා විහිදුණු ප්‍රාදේශිය මධ්‍යස්ථාන රැසක් ද කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක කරනු ලබයි.

ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන පාඨමාලා ප්‍රධාන වශයෙන් නාභිගත කොට ඇත්තේ අධ්‍යාපන වෘත්තීකයින්ගේ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා ඉටුකිරීම සහ පහත සඳහන් අරමුණු ඉටුකරගත හැකි ගෞරවණිය ගුරු පිරිසක් බිහි කිරීමේ අපේක්ෂා පෙරදැරි කර ගනිමිනි.

- අධ්‍යාපනයේ නව දිශානතීන් හඳුනාගැනීමට සමත්කම් දක්වන;
- පුළුල් විෂය දැනුම සහ එය පංතිකාමරය තුළ මනා ලෙස භාවිත කිරිමට සමත්;
- ඉගැන්වීමේ සහ පංති කාමර කළමනාකරණ කුශලතා උසස් මට්ටමින් සංවර්ධනය කරගත හැකි;
- සිසුන්ගේ පෞද්ගලික විවිධතාවලට ගැලපෙන අයුරින් ඵලදායී වැඩ සැලසුම් කළ හැකි;
- දෙමව්පියන්ගේ දැනුම හා ශක්‍යතා හා හැකියා ඵලදායී ලෙස ලබාගැනිමට වැඩ සැලසුම් කළ හැකි;
- හොඳ උගැන්වීමක් සඳහා අවශ්‍ය පොදු නිපුණතා ගොඩනංවා ගත හැකි;
- කාර්යබද්ධ පුහුණුව සංවර්ධනය කර ගැනීමට ඉවහල්වන කුඩා පරිමාණයේ පර්යේෂණවල නියැළෙන;
- නිපුණතා පාදක කාර්යසාධනය සඳහා පුහුණුව ලබාගන්නා සහ
- උගැන්වීම සඳහා ස්වයංනිර්මාණී එළඹුමක් සංවර්ධනය කරගත හැකි;

පහත වගුව ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ විවිධ දෙපාර්තමේන්තු විසින් සහ ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය විසින් 2015 වසරේ දී පවත්වන ලද පාඨමාලා සහ එහි සහභාගිත්වය පෙන්නුම් කරයි.

වගුව 2: ගුරු අධ්‍යාපන පාඨමාලා පිළිබඳ තොරතුරු - 2015

| පාඨමාලාව | වගකීම දරන දෙපාර්තමේන්තුව | පාඨමාලාව පැවැත්වෙන ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| **පශ්චාත් උපාධි පාඨමාලා** | | | |
| අධ්‍යාපන දර්ශනපති උපාධි පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ. | 10 |
| අධ්‍යාපනපති පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ./යාපනය | 266 |
| **පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා** | | | |
| පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ /ප්‍රාදේශීය මධ්‍යස්ථාන 24 | 4560 |
| **උපාධි පාඨමාලා** | | | |
| අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ/මධ්‍යස්ථාන 38 | 2100 |
| අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ | 263 |
| **ඩිප්ලෝමා පාඨමාලා** | | | |
| දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි | ජා.අ.ආ | 14 |
| පූර්ව ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව | ප්‍රාථමික අධ්‍යාපනය | ජා.අ.ආ | 40 |
| විශේෂ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | අන්තර්කරණ අධ්‍යාපන | ජා.අ.ආ. | 51 |
| සංඥා භාෂා ඩිප්ලෝමා පාඨමාලාව | අන්තර්කරණ අධ්‍යාපන | ජා.අ.ආ | 19 |
| උපදේශනය හා මාර්ගෝපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | උපදේශන හා මාර්ගෝපදේශන ඒකකය | ජා.අ.ආ. | 54 |
| දෙවන බසක් ලෙස ජපන් භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | විදේශ හා සම්භාව්‍ය භාෂා අංශය | ජා.අ.ආ. | 12 |
| **සහතික පත්‍ර පාඨමාලා** | | | |
| අතිරේක භාෂා සංවර්ධන පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ/මධ්‍යස්ථාන 38 | 625 |

## 6.1 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල හා ගුරු විද්‍යාලවල ගුණාත්මක සංවර්ධනය

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හරහා පූර්ව සේවා ගුරු අධ්‍යාපන විෂයමාලා ක්‍රියාත්මක කිරීම මෙන්ම ගුරු මධ්‍යස්ථාන හරහා සේවාස්ථ ගුරු අධ්‍යාපනය සංවර්ධනය කිරීමත් ජාතික අධ්‍යාපන ආයතනයට අයත් වගකීමකි. ඒ අනුව 2015 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ පහත දැක්වෙන කාර්ය පූර්ව සේවා හා සේවාස්ථ ගුරු පුහුණුවට අදාළව ජාතික අධ්‍යාපන ආයතනය විසින් ඉටුකර ඇත.

- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ගුරු පුහුණු කටයුතු සඳහා අවශ්‍ය සමාජ විද්‍යා විෂය ධාරාවට අදාළ අතිරේක විෂයමාලා පොත් 3ක් (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) භාෂාවලින් සකස් කිරීම.
- ගුරු අධ්‍යාපනඥයන් 50 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- ධර්මාචාර්ය ගුරු සහායකයන් ලෙස බඳවා ගත් 386 දෙනෙකු සඳහා දිවයිනපුරා පිහිටි මධ්‍යස්ථාන 11ක් කේන්ද්‍ර කරගනිමින් ගුරු පුහුණු වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම.
- පාසල් පද්ධතියේ 6-10 ශ්‍රේණි සඳහා හඳුන්වා දුන් යථාර්ථවත් විෂයමාලාව පිළිබඳව ගුරු අධ්‍යාපනඥයින් 110 දෙනෙකු දැනුවත් කිරීම.
- ගුරු විද්‍යාල වල සාමාන්‍ය විෂයමාලාවේ අභ්‍යන්තර පරීක්ෂණ සඳහා සිංහල දෙමළ මාධ්‍ය වලින් ප්‍රශ්න පත්‍ර 15ක් සකස් කිරීම.
- ඉහත කාර්යයන්ට අමතරව 2013 වසරේ දී නව විෂයධාරාවක් ලෙස පද්ධතියට හඳුන්වාදුන් තාක්ෂණ විද්‍යා ධාරාව උගන්වන ගුරුවරුන් සඳහා අධ්‍යාපනවේදී (ඉංජිනේරු) පාඨමාලාවක් නිර්මාණය කිරීම සහ ඒ සඳහා ගුරුවරුන් 260 දෙනෙකු බඳවා ගැනීමට හැකිවීම 2015 වර්ෂය තුළ ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය ලබාගත් විශේෂ ජයග්‍රහණයකි

## 6.2 ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ පාඨමාලා සඳහා විභාග පැවැත්වීම.

ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලබන විවිධ පාඨමාලාවල ඇගයීම් කටයුතු මනාලෙස ඉටුකරගැනිම සඳහා කාර්යක්ෂම හා ඵලදායී විභාග ක්‍රමයක් පවත්වාගෙන යාම විභාග දෙපාර්තමේන්තුවට පැවරී ඇති ප්‍රධාන වගකීමයි. පහත සඳහන් පාඨමාලා හා සම්බන්ධ විභාග පැවැත්වීම, ඇගයීම සහ සහතික නිකුත් කිරීම 2015 වසරේ දී ඉටු කොට ඇති අතර, ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලබන විභාග සඳහා විභාග පටිපාටි සවිමත් කිරීමට හැකිවීම 2015 වසරේ දී ලැබූ විශේෂ ජයග්‍රහණයකි.

- කොරියානු භාෂාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (විශේෂ දෙවන වර විභාගය සෙමෙස්තරය - 1 )
- කොරියානු භාෂාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (විශේෂ දෙවන වර විභාගය - සෙමෙස්තරය - 11 )
- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (2013/2014) අවසන් විභාගය
- සංඥා භාෂා ඩිප්ලෝමා 2014 -අවසන් විභාගය
- අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාව 2013/2015 (පළමු කොටස)
- අධ්‍යාපන කළමනාකරණ විද්‍යාපති විභාගය
- 6-11 ශ්‍රේණි සඳහා විද්‍යාව ඉගැන්වීම පිළිබඳ උසස් ඩිප්ලෝමා විභාගය
- අධ්‍යාපනපති 2013/2015 අවසන් විභාගය
- පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2014/2015 අවසන් විභාගය
- කොරියානු භාෂාව පිළිබඳ ඩිප්ලෝමා විභාගය - පළමු වාරය
- දෙවන බසක් ලෙස ඉංග්‍රීසි උගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2014 / 2015 අවසන් විභාගය
- අධ්‍යාපනවේදී (පළමු කොටස) විශේෂ විභාගය
- අතිරේක භාෂා සංවර්ධන පාඨමාලාව - 2015 (ලිවීම හා ශ්‍රවණය - පළමු මට්ටම)
- අතිරේක භාෂා සංවර්ධන පාඨමාලාව - 2015 වාචික පරික්ෂණය)
- කොරියානු භාෂාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (තෙවන වාරය)
- පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පූර්ණ කාලීන පාඨමාලා - අවසන් විභාගය
- අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාව - 2011/ 2013 (තෙවන කොටස )
- බ්‍රේල් අධ්‍යාපනය පිළිබඳ කෙටිකාලීන සහතිකපත්‍ර පාඨමාලාව

## 7.0 විකල්ප අධ්‍යාපනය

විකල්ප අධ්‍යාපන පීඨය යටතේ ක්‍රියාත්මක වන අන්තර්කරණ අධ්‍යාපන, විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තු හා මාර්ගෝපදේශන හා උපදේශන අංශය මගින් 2015 වර්ෂය තුළ ඉටුකළ කාර්ය පහත සඳහන් වෙයි.

## 7.1 අන්තර්කරණ අධ්‍යාපනය

" සැමට අධ්‍යාපනය" යන සංකල්පය යථාර්ථයක් බවට පත් කර ගැනීමේ දී අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට විශේෂ ස්ථානයක් හිමිවේ. විශේෂ අවශ්‍යතා සහිත දරුවන්

සඳහා යෝග්‍ය වන පරිදි විෂයමාලාව සංවර්ධනය කිරීම, විශේෂ අධ්‍යාපන ගුරුවරුන්ට හා ගුරු උපදේශකවරුන් සඳහා අවශ්‍ය පුහුණු කටයුතු සිදුකිරීම හා අතිරේක විෂයමාලා ද්‍රව්‍ය සම්පාදනය වැනි කාර්යවල වගකීම පැවරී ඇත්තේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුවටය. ඊට අමතරව මෙම දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමා, සංඥා භාෂා ඩිප්ලෝමා ආදි පාඨමාලා ඔස්සේ අන්තර්කරණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළි ගුරුවරුන්හට වෘත්තීය සංවර්ධන අවස්ථා සම්පාදනය කෙරේ. අදාළ කාලපරිච්ඡේදය තුළ උක්ත දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

- බ්‍රේල් අධ්‍යාපන පුහුණු පැකේජය යාවත්කාලීන කිරීම හා මෘදු කුසලතා සංවර්ධනය සඳහා වැඩමුළු 04 ක් පැවැත්වීම
  පුහුණු පැකේජයක් උපයෝගී කර ගනිමින් ඉගෙනුම් දුෂ්කරතා සහිත ළමයින්ට ඉගැන්වීම පිළිබඳ ව ගුරුවරුන් හා ගුරු උපදේශකවරුන් 80 දෙනෙකු පුහුණු කිරීම.
- භූගෝලවිද්‍යා විෂය සඳහා සංඥා භාෂා ශබ්ද කෝෂය ලිවීම ආරම්භ කිරීම.
- විශේෂ අධ්‍යාපන සඟරාව එළිදැක්වීම.
- සමාජ සේවා අමාත්‍යංශය විසින් පවත්වනු ලබන සංඥා භාෂා පාඨමාලාව සඳහා අවශ්‍ය මගපෙන්වීම ලබාදීම.
- විශේෂ අධ්‍යාපනයෙහි පෙනීම දුර්වල ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන සාධනය සමඟ සැසඳීමේ දී ශ්‍රවණ දුර්වලතා සහිත දරුවන්ගේ අධ්‍යාපන සාධනය පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීම.

## 7.2 විද්‍යුත් ප්‍රචාරණය

නොවිධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉතා ප්‍රබල මෙන් ම ආකර්ශණීය ඉගෙනුම්- ඉගැන්වීම් මෙවලමක් ලෙස ප්‍රයෝජනයට ගන්නා රූපවාහිනිය, ගුවන්විදුලිය හා සංයුක්ත තැටි බඳු ඉලෙක්ට්‍රොනික ඉගෙනුම් ද්‍රව්‍ය භාවිත කරමින් පාසල් ප්‍රජාව පමණක් නොව, ඊට පරිබාහිර විවිධ සමාජ කණ්ඩායම් ඉගෙනුම් සමාජයක් කරා ගෙන යෑමේ කාර්යභාරය විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව ඉටු කරයි. විෂයමාලාවේ දුරවබෝධ සංකල්ප පැහැදිලි කරලීම සඳහාත්, විෂයමාලාවේ කරන වෙනස්කම් පිළිබඳ ව ප්‍රජාව දැනුවත් කිරීම සඳහාත්, ගීතය, සංගීතය, නාට්‍ය වැනි සෞන්දර්යාත්මක මාධ්‍ය යොදා ගනිමින් ජන මනස පුබුදුවාලීම සඳහාත් විවිධ වැඩ සටහන් නිෂ්පාදනය කිරීම විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව විසින් ආයතනය ආරම්භයේ සිට ම කර ගෙන එනු ලබයි.

2015 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුවෙන් ඉටු කරන ලද කටයුතුවල ප්‍රගතිය පහත සඳහන් වෙයි.

- අධ්‍යාපන පොදු සහතිකපත්‍ර උසස් පෙළ නව තාක්ෂණික විෂයධාරාවේ විෂයවල ඉගෙනුම් උගැන්වීම් ක්‍රියාවලිය පහසුකරලීම සඳහා අධ්‍යාපන රූපවාහිනී වැඩසටහන් 80ක් සැකසීම ආරම්භ කිරීම.
- ඉගෙනුම් උගැන්වීම් ක්‍රමවේද සාරවත් කිරීම සඳහා අධ්‍යාපන සී.වී.ඩී. වැඩසටහන් 12ක් නිෂ්පාදනය කිරීම.
- 2015 වසරේ දී පද්ධතියට හඳුන්වා දුන් යථාර්ථවත් විෂයමාලාව පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ඩී.වී.ඩී. වැඩ සටහන් 09ක් නිෂ්පාදනය කිරීම.

## 7.3 මාර්ගෝපදේශන හා උපදේශන සේවා

පාසල් පද්ධතිය හා සම්බන්ධ ප්‍රජාවගේ මානසික ව්‍යාකූලතාව නැති කිරීම සඳහා මනෝ සමාජයීය මැදිහත් වීමක් ලබාදීමේ අරමුණ ඇතිව 2006 වසරේ ජූනි මස උපදේශන හා මාර්ගෝපදේශන ඒකකය ජාතික අධ්‍යාපන ආයතනයෙහි ස්ථාපිත කරන ලදි. ඉගෙනුමට ප්‍රියමනාප පරිසරයක් ඇතිකරන, වෘත්තීය පුහුණුව තුළින් ගුරු භවතුන්ට සහය වීම මගින් දරුවන්ගේ ආත්ම විශ්වාසය හා ආත්මාභිමානය ඇති කිරීම සඳහා යොමු කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතා ලගාකර දීම ඒ යටතේ සිදුකරන ප්‍රධාන කාර්ය වෙයි. ශිෂ්‍ය ප්‍රජාව සඳහා වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන සේවා සැපයීම ද මෙම ඒකකයට පැවරී ඇති තවත් වගකීමකි. 2015 වර්ෂය අවසාන වන විට මෙම ඒකකය විසින් සම්පූර්ණ කරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

- පාසල් සිසුන් හා දෙමාපියන් 64 දෙනෙකු සඳහා අභ්‍යන්තරික ව උපදේශන සැසි පැවැත්වීම.
- ගුරුවරුන් 225ක් සඳහා උපදේශනය සම්බන්ධව පුහුණු කිරීම
- පාසල් උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ වෘත්තීය උපදේශනය කොටස සඳහා අලුත් විෂය නිර්දේශයක් සැකසීම.

## 7.4 විවෘත ඉගෙනුම

විවිධ හේතු නිසා පාසල් අධ්‍යාපනය අහිමි වූ පුද්ගලයන්ට අධ්‍යාපනයේ මංපෙත් විවෘත කර දීම සඳහා දුරස්ථ පාඨමාලා පැවැත්වීම අරමුණු කරගෙන විවෘත පාසල් දෙපාර්තමේන්තුව පිහිටුවා තිබේ. විවෘත පාසල දුරස්ථ හා විවෘත ඉගෙනුම් ක්‍රම උපයෝගි කර ගනිමින් අධ්‍යාපනය ඉගෙනුම් ලාභියා වෙතට ගෙන යන ක්‍රියාවලියකි. අධ්‍යාපන සුදුසුකම්, රැකියාවක යෙදී සිටීම හෝ සමාජ ආර්ථික පසුබිම ආදී කිසිවක් නොසලකා සියලු දෙනාටම අධ්‍යාපනය ලබාදීමේ අවස්ථා පුළුල් කිරීමක් එමගින් අපේක්ෂා කෙරේ. ඉගෙනුම් ලාභියාගේ අභිමතය පරිදි ඉගෙනුම ආරම්භ කර තමා කැමති මාධ්‍යයක් උපයෝගි කරගනිමින් උචිත පියවරක සිට ඉගෙනීම සඳහා විවෘත පාසල පහසුකම් සපයයි.

ජාතික අධ්‍යාපන ආයතනයේ විවෘත පාසල් ඒකකය විසින් විවිධ හේතු මත පාසල් අධ්‍යාපනය අහිමි වුවන්හට අධ්‍යාපන මංපෙත් විවර කර දීම සඳහා දීර්ඝ කාලයක් මුළුල්ලේ කරන ලද අනුස්මරණීය සේවය අගය කරමින් ලෝකයේ රටවල් අතරින් යුනෙස්කෝ King Sejong ත්‍යාගය පිරිනැමීම සඳහා ශ්‍රී ලංකාව තෝරාගැනිම ජාතික අධ්‍යාපන ආයතනයේ විවෘත පාසල් ඒකකය 2015 වසරේ දී ලබා ගත් විශිෂ්ට ඇගයීමකි.

විවෘත පාසල් ඒකකය විසින් විවෘත ඉගෙනුම සම්බන්ධව 2015 වර්ෂයේ දී ඉටුකළ කාර්ය පහත සඳහන් වෙයි.

- විවෘත ප්‍රාථමික පාඨමාලාව සහ විවෘත ද්විතීයික පාඨමාලාව යනුවෙන් පාඨමාලා 2ක් පවත්වා ගෙන යාම හා එම පාඨමාලාවලට අදාළ අතිරේක විෂයමාලා පොත් 02ක් සකස් කිරීම.
- ප්‍රාදේශීය මධ්‍යස්ථාන 07ක වැඩ කටයුතු නියාමනය කිරීම.
- විවෘත ඉගෙනුම් සම්බන්ධ විශේෂ අවස්ථා ඇතුලත් ඩී.වී.ඩී. තැටියක් නිර්මාණය කිරීම.
- විවෘත පාසල් ඉගෙනුම්ලාභින් සඳහා සැසි 36ක් පැවැත්වීම.

## 8.0 පර්යේෂණ, සැලසුම් හා සංවර්ධනය

අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය උදෙසා විෂයමාලා සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ඉවහල් වන විවිධ පර්යේෂණ කිරීම ජාතික අධ්‍යාපන ආයතනය මගින් ඉටු කරන අතර, යථෝක්ත කාර්ය යථාර්ථයක් බවට පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු පර්යේෂණ දෙපාර්තමේන්තුව යටතේත් ආයතනයේ කාර්ය ඉටුකිරීම සඳහා අවශ්‍ය මුල්‍ය සම්පත් ලබා දීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සහ නියාමනය සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව යටතේත් ක්‍රියාත්මක වෙයි.

## 8.1 පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව

අධ්‍යාපන පර්යේෂණ ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම සහ නියාමනය අධ්‍යාපනයේ විවාදාත්මක අංශ සම්බන්ධ ව අදහස් හා මත සංවාදය සඳහා සාකච්ඡා මණ්ඩප සැලසුම් කිරීම, අධ්‍යාපනයේ නියැළි පිරිස් තුළ පර්යේෂණ කුසලතා ප්‍රවර්ධනය සඳහා අවස්ථා සම්පාදනය, පුද්ගලයන්ට සහ ආයතනවලට පර්යේෂණ ප්‍රදාන ලබාදීම තුළින් පර්යේෂණ හැකියා සංවර්ධනයට අවස්ථා සැලසීම සහ පර්යේෂණ තොරතුරු ප්‍රචලිත කිරීම පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වෙයි. මෙම දෙපාර්තමේන්තුව විසින් 2015 ජනවාරි - දෙසැම්බර් කාලසීමාව තුළ නිම කරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

- ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලබන වෘත්තීය සංවර්ධන පාඨමාලා සඳහා භාවිත කිරීමට ක්‍රියාමූලික පර්යේෂණ පිළිබඳ අත්පොතක් සැකසීම.
- යථාර්ථවත් විෂයමාලාව 2015 වර්ෂයේ සිට පාසල් පද්ධතියේ 6 සහ 10 ශ්‍රේණි සඳහා ක්‍රියාත්මක කිරීමට පූර්වගාමීව 2014 වර්ෂයේ දී ගුරු උපදේශකවරුන් දැනුවත් කිරීම සඳහා පවත්වන ලද පුහුණු වැඩ සටහන පිළිබඳව කරන ලද සමීක්ෂණයේ අවසන් වාර්තාව සැකසීම.
- පාසල් පාදක ඇගයීම් වැඩසටහන අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ පංති වල ක්‍රියාත්මක කිරීම පිළිබඳව සිදුකරන ලද අධ්‍යයනයේ අවසන් වාර්තාව සැකසීම.
- පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය පිළිබඳව සමාජයේ මත විමසුම සඳහා කරන ලද සමීක්ෂණයේ අන්තර්කාලීන වාර්තාව සැකසීම.
- 26 වන සී.ඩබ්.ඩබ්. කන්නන්ගර සමරු දේශනය "කන්නන්ගර ප්‍රතිසංසකරණ හා උදාවන ශ්‍රී ලාංකික දැනුම් ආර්ථිකය" යන මාතෘකාව යටතේ කොළඹ විශ්ව විද්‍යාලයේ සේවාර්ජිත මහාචාර්ය එස්. සන්දරසේගරම් මහතා විසින් පවත්වනු ලැබීම.

## 7.2 සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව

ආයතනය සතු භෞතික, මූල්‍ය හා මානව සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස උපයෝගී කර ගනිමින්, ආයතනයේ අරමුණු හා ඉලක්ක, ජාතික අරමුණු හා ඒකාබද්ධ කිරීමේ අභිලාෂය ඇති ව කටයුතු කිරීම සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරයයි.
2015 වසරේ සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව ඉටුකළ ප්‍රමුඛ කාර්ය පහත සඳහන් වෙයි.

- 2014 වර්ෂයේ වාර්ෂික ප්‍රගති වාර්තාව සහ 2015 වර්ෂයේ කාර්තුමය ප්‍රගතිවාර්තා, සහ කාර්ය සාධන වාර්තා සකස් කිරීම.

- 2016 වර්ෂයට අදාළ අයවැය ඇස්තමේන්තුව සහ 2016 අයවැය වාර්තාව, 2017 - 2019 මධ්‍යකාලීන පස් අවුරුදු සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සකස් කිරීම.
- 2015 ප්‍රසම්පාදන සැලැස්ම සඳහා දෙපාර්තමේන්තු අවශ්‍යතා සැලකිල්ලට ගෙන ලී බඩු සහ කාර්යාලීය උපකරණ ලැයිස්තු සකස් කිරීම.
- මහ බැංකුව, අධ්‍යාපන අමාත්‍යංශය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව, මුදල් අමාත්‍යංශය ආදි ආයතන වල ඉල්ලීම පරිදි ප්‍රගති වාර්තා සකස් කිරීම.

## 9.0 පරිපාලන, මූල්‍ය හා සහාය සේවා

ආයතනයේ විෂයමාලා සංවර්ධන, අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා ගුරු අධ්‍යාපන, සැමට අධ්‍යාපන, පර්යේෂණ සැලසුම් හා සංවර්ධන පීඨ මගින් කරනු ලබන සියලු ම කාර්ය සඳහා මූල්‍ය, භෞතික සම්පත් හා කළමනාකරණ සේවා සම්පාදනය සහ සහාය සේවා සැපයීම, පරිපාලන, මූල්‍ය හා සහායක සේවා අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. පරිපාලන මූල්‍ය හා සහාය සේවා අංශය යටතේ ක්‍රියාත්මක වන ඒ ඒ දෙපාර්තමේන්තු විසින් 2015 වසරේ දී ඉටුකරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

## 9.1 පරිපාලන දෙපාර්තමේන්තුව

ආයතනයේ එදිනෙදා පරිපාලන කාර්ය හා සම්බන්ධ සියලු ම කටයුතු හා කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඔවුන්ට අදාළ පුහුණු අවස්ථා ලබා දීමේ කටයුතු මානව සම්පත් සංවර්ධන හා පාලන දොපර්තමේන්තුව මගින් සිදු කරයි.

එදිනෙදා ඉටුකරනු ලබන සාමාන්‍ය පරිපාලන රාජකාරි කටයුතු වලට අමතරව, 2015 ජනවාරි - දෙසැම්බර් කාලසීමාව ඇතුළත පරිපාලන දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන බඳවා ගැනීම් සිදු කර ඇත.

**බඳවා ගැනීම්**

| | | |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | - | 05 |
| කථිකාචාර්ය | - | 04 |

**උසස්වීම් ලබාදීම**

| | | |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | - | 12 |
| කථිකාචාර්ය | - | 08 |

- ඊට අමතර ව ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 36 දෙනෙකුගේ පාඨමාලා සම්බන්ධ ඉල්ලීම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන මෙන් ම අධ්‍යයන නිවාඩු ලබා දීමත්;
- ආයතනයේ පවත්නා බඳවා ගැනීමේ පටිපාටි සංශෝධනය කිරීම සඳහාත් වැටුප්තල වල පවත්නා විෂමතා ඉවත් කිරීම සඳහාත් අභ්‍යන්තර හා බාහිර පුද්ගයින්ගෙන් සමන්විත කමිටුවක් පත් කර අදාළ කටයුතු ක්‍රියාත්මක කිරීම ආරම්භ කොට ඇත.

## 9.2 මුදල් දෙපාර්තමේන්තුව

ආයතනයේ සියලු ම කාර්ය සඳහා මූල්‍ය සම්පත් ලබා දීම, ආදායම් හා පිරිවැය වාර්තා මූල්‍ය නීතිරීති අනුව පවත්වාගෙන යෑමේ කටයුතු මුදල් දොපර්තමේන්තුව මගින් සිදු කරයි. ඒ යටතේ එම දෙපාර්තමේන්තුව ඉටු කළ ප්‍රධාන වැඩසටහන් පහත සඳහන් වෙයි.

- ස්ථාවර වත්කම් ලේඛනය හා ඇගයීම් පටිපාටි සකස් කොට අවසන් කිරීම.
- 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අවසන් කිරීම.
- 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අවසන් වාර්තාව සකස් කිරීම.

## 9.3 ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව

ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීම, නඩත්තු කටයුතු, විදුලි සහ දුරකථන සේවා පවත්වා ගෙන යාම, යටිතල පහසුකම් සැපයීම, පවිත්‍රතා සහ ආරක්ෂක සේවා සම්බන්ධීකරණය හා ආයතනයේ භෞතික පරිසරය අධ්‍යාපනික කාර්යවලට සමීප වන අයුරින් පවත්වාගෙන යෑම ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලැබේ. ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මගින් 2015 වර්ෂයේ දෙසැම්බර් වන විට ඉටුකර ඇති කාර්ය පහත දැක්වේ.

- නව ශ්‍රවනාගාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු සහ මල ජල පිරියම් පද්ධතිය නවීකරණය කිරීම.
- මහරගම සහ මීපේ පරිශ්‍රයෙහි ලොකු කුඩා ප්‍රතිසංස්කරණ හා අලුත්වැඩියා කටයුතු 31ක් සම්පූර්ණ කිරීම.

## 9.4 පුස්තකාල සේවා

ජාතික අධ්‍යාපන ආයතනයේ පුස්තකාලය ආයතනයේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට අමතරව, අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය හා සම්බන්ධ විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්, ගුරුවරුන් හා සිසුන් මෙන්ම අධ්‍යාපන විද්‍යාපීඨ හා ගුරු විදුහල් කථිකාචාර්යවරුන් සහ වෙනත්

ආයතනවල අධ්‍යාපනඥයින්ගේ නිරන්තර පරිහරණයට බඳුන් වේ. එම පුස්තකාලයට 2015 වසරේ දී අලුතින් එකතු කරගන්නා ලද පොත් පත් හා සංයුක්ත තැටි ප්‍රමාණය පහත දැක්වේ.

| | |
|---|---|
| පොත් | 829 |
| පොත් (පරිත්‍යාග) | 87 |
| විෂයමාලා ද්‍රව්‍ය | 02 |
| අධ්‍යාපනික වාර්තා | 54 |
| දේශීය වාර සඟරා (පරිත්‍යාග) | 02 |
| දේශීය වාර සඟරා | 05 |
| විදේශීය වාර සඟරා (පරිත්‍යාග) | 05 |

## 9.5 මුද්‍රණ හා ප්‍රකාශන

මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් අදාළ කාලසීමාව තුළ මුද්‍රණය කරන ලද ප්‍රකාශන වර්ගය හා ප්‍රමාණය පහත දැක්වේ.

- ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ - 14
- අතිරේක විෂයමාලා ද්‍රව්‍ය - 204
- වෙනත් ප්‍රකාශන - 51
- සහතික - 13
- මොඩියුල අමතර කියවීම් පොත් - 06
- විෂය නිර්දේශය - 31

ඉහත සඳහන් මුද්‍රණ සහ ප්‍රකාශන කාර්යයන්ට අමතරව, පොත් ප්‍රදර්ශන අවස්ථා හතරකට සහභාගි වීමට අවස්ථා ලබා ගැනීමට 2015 වසරේ දී අවස්ථාව ලබා ගෙන ඇත.

R.5355


# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. — ඊඩියු/සී/එන්අයිඊ/1/15 | ඔබේ අංකය / உமது இல. / Your No. — | දිනය / திகதி / Date — 2016 සැප්තැම්බර් [illegible] දින |

අධ්‍යක්ෂ ජනරාල්,

ජාතික අධ්‍යාපන ආයතනය

**ජාතික අධ්‍යාපන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික අධ්‍යාපන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතේ 19 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2016 ජූලි 26 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.




අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී මුදල් හා මුදල් සමාන දෑ ගණනය කිරීමේදී අනැති මුදල් හා කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් වලින් යුක් ආයෝජන සැලකිල්ලට ගත යුතු වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී රු. 321,948,287 ක කෙටිකාලීන තැන්පතු මුදල් හා මුදල් සමාන දෑ වශයෙන් සලකා ගණනය කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය හෝ අලාභය වර්ෂයේ ලාභයට ගැලපිය යුතු වුවද ආයතනය විසින් ඉකුත් වර්ෂවල ස්ථාවර වත්කම් අපහරණය තුලින් ඇති වූ ලාභාලාභ අපහරණ ලාභ අරමුදල නම් අරමුදලක් හරහා ගැලපීම් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය වන විට එහි ශේෂය රු. 3,640,844 ක් වී තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

ආයතනයට හිමිකමක් නොමැති එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි ව්‍යාපෘතියකට අයත් රු. 4,000,000 ක් වටිනා වාහන 02 ක් ආයතනයේ වත්කම් ලෙස 2014 වර්ෂයේ සිට ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 213,909 ක ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි. එය මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

2016 ජනවාරි 14 වන දින සංයුක්ත තැටි පිළිබඳව සිදු කරන ලද භෞතික නියැදි පරීක්ෂාවේදී තොග ගබඩාව තුල විෂයයන් 44 කට අදාල රු.1,252,600 ක් වටිනා සංයුක්ත තැටි 6263 ක ප්‍රමාණයක් පැවති අතර එම ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ තොග ලේඛනවල ශේෂය සමඟ සැසදීමේදී රු. 412,000 ක් වටිනා සංයුක්ත තැටි 2060 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාසැල් පදනම් කරගත් ඇගැයීම් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 3,237,800 ක මුදලක් 2008 වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු නොකර ලැබිය යුතු ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) එකතුව රු. 3,306,017 ක් වූ ගෙවිය යුතු වියදම් තුල වර්ෂ 2 සිට වර්ෂ 5 අතර එකතුව රු. 1,397,421 ක් හා වර්ෂ 05 ඉක්මවූ රු. 391,613 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.4 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2015 මාර්තු 10 දිනැති අංක 03/2014(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සන්නිවේදන පහසුකම් ලබන නිලධාරීන්ට හිමි උපරිම දුරකථන සීමාවන්ට අදාල රාජ්‍ය මුදල් චක්‍රලේඛය වැරදි ලෙස අර්ථකථනය කරමින්, ආයතනය විසින් 2015 ජූලි 02 දින අංක 452 (1) දරන අභ්‍යන්තර පාලන චක්‍රලේඛයක් නිකුත්කර අදාල නිලධාරීන්ට රු.91,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9.7 හා 9.8 ඡේද | කොළඹ ඉගෙනුම් මධ්‍යස්ථානයේ දර්ශන ගුරි පාඨමාලාව හදාරන නිලධාරීන් 6 දෙනා සඳහා 2014 නොවැම්බර් සිට 2015 දෙසැම්බර් දක්වා එක් අයෙකුට මාසික දීමනාව ඇ.ඩො. 150 බැගින් එකතුව රු. 1,663,200 ක් භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. |
| (ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 8.9.1 (ආ) වගන්තිය | වටිනාකම රු.500,000 ක් ඉක්මවන ප්‍රසම්පාදන වෙනුවෙන් ගිවිසුම් අත්සන් කළ යුතු වුවත් එසේ සිදුනොකර අවස්ථා 12 කදී එකතුව රු.29,788,288 ක් වටිනා ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබුණි. |
| (ඇ) 2010 සැප්තැම්බර් 06 දිනැති ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ අතිරේක 9.3.1 (ආ) ඡේදය | මෝටර් වාහන හා උපකරණ අලුත්වැඩියා කිරීමේදී රු. 200,000 කට වඩා වැඩි වියදම් සඳහා අදාල රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද සමාලෝචිත වර්ෂය තුලදී අවස්ථා 3 කදී දරන ලද එකතුව රු.870,106 ක අලුත්වැඩියා වියදම් සම්බන්ධයෙන් එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 157,631,150 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 59,870,748 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 97,760,402 ක වර්ධනයක් නිරීක්ෂණය විය. 2015 වර්ෂයේදී ආයතනයේ වියදම් රු. 51,914,694 කින් වැඩි වී තිබුණද ආදායම රු. 149,675,095 කින් වැඩිවීම නිසා ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට හේතු වී තිබුණි.

### 3.2 දායකත්වය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ මූල්‍ය අතිරික්තය සියයට 64 කින් අඩුවී තිබුණද දායකත්වය අඩුවීම සියයට 7 ක් පමණි. 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩව මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වී තිබූ අතර සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් ගැලපීමෙන් පසු ආයතනයේ සමස්ථ දායකත්වය 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා පිළිවෙලින් රු.318,104,459 කින් රු.336,995,276 කින් හා රු.500,421,340 කින් වර්ධනය වී තිබුණි. ඒ අනුව 2013 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂය වනවිට දායකත්වය සියයට 57 කින් ඉහල ගොස් තිබුණි.

### 3.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ආයතනයේ ජංගම අනුපාතය 2015 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් 5.4:1 ක් හා 3.3:1 ක් විය. එසේම ක්ෂණික අනුපාතය 5.2:1 ක් හා 2.8:1 ක් විය. ජංගම වත්කම් තුල සියයට 86 ක් නියෝජනය කරනුයේ භාණ්ඩාගාර බැඳුම්කර හා බැංකු ජංගම ගිණුම් ශේෂ වන අතර ආයතනයේ විශාල වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුල රඳවා තිබුණි. ආයතනය සතුව ඇති බැංකු ගිණුම් 6 න් 2 ක 2015 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 96 ක් හා රු. මිලියන 88 ක ශේෂයක් තිබූ අතර, අවශ්‍යතා ඉක්මවා මුදල් ශේෂ පවත්වා ගැනිමත් කෙටිකාලීන ආයෝජන සිදුකිරීමත් හේතුවෙන් ජංගම හා ක්ෂණික වත්කම් අනුපාත වැඩිවීමට හේතුවී තිබුණි.

## 3.4 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වූ නිළධාරීන් 06 දෙනෙකු විසින් ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් එකතුව රු. 11,651,636 ක් වන්දි ඉල්ලා ආයතනය විසින් අධිකරණ වල නඩු 06 ක් ගොනුකර තිබුණු අතර ඉන් එක් නඩු තීන්දුවක් ප්‍රකාරව වාරිකය රු.14,604 බැගින් රු.876,236 ක් වාරික 60 කින් ගෙවා අවසන් කිරීමට තීරණය කර තිබුණි.

(ආ) නිලධාරීන් හතර දෙනෙකු මූලා වංචාවක් මත සේවයෙන් පහ කිරීම සහ ගුරු පුහුණු සහතික ලබා ගැනීම සම්බන්ධයෙන් නඩු 4 ක් පවරා තිබුණි. ඉන් නඩු දෙකකට අදාල නිලධාරීන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,336,075 ක හිඟ වැටුප් ගෙවා ඔවුන් නැවත සේවයේ පිහිටුවා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සංවර්ධනය හා ප්‍රවර්ධනය, විවිධ අධ්‍යාපන විෂයයන්හි පශ්චාත් උපාධි අධ්‍යාපනය, අධ්‍යාපන පද්ධතියේ කාර්යසාධනය හා අධ්‍යාපන ක්‍රම පිළිබඳ අධ්‍යයනය කිරීම, අධ්‍යාපන පද්ධතියේ නවීකරණ ක්‍රියාවලි ආරම්භ කිරීම හා අධ්‍යාපන කාර්යමණ්ඩලයේ වෘත්තීය නිපුණත්වය වැඩිකිරීම ආදී අරමුණු පෙරදැරි කරගත් ජාතික අධ්‍යාපන ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගතිය පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළමු වන ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සම්බන්ධයෙන් පළාත් සම්පත් දායක කණ්ඩායම් මගින් සම්පත් දායකයන් 600 ක් පුහුණු කිරීමට ඉලක්කය වුවත් වැඩසටහන් 08 ක් මගින් සම්පත් දායකයන් 477 ක් පමණක් පුහුණු කර තිබුණි.

(ආ) පූර්ව ළමාවිය සංවර්ධන පිරිවිතරයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම (වයස අවුරුදු 7), දත්ත වාර්තා විශ්ලේෂණය කිරීම හා එහි ප්‍රතිඵල දැනුම්දීම් සිදුකළ යුතු වුවද දත්ත විශ්ලේෂණය පමණක් සිදු කර තිබුණි.

(ඇ) දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ ඩිප්ලෝමාව. 2014/2015 කණ්ඩායමේ මාතෘකා 05 ක් යටතේ පර්යේෂණ යෝජනා අනුමත කිරීම සිදුකර නොතිබුණු අතර 2015/2016 කණ්ඩායමේ ව්‍යාපෘති 16 ක් ඇගයීම් කිරීම කළ යුතු වුවද එය සිදුකර නොතිබුණි.

(ඈ) අධ්‍යාපන පර්යේෂණ ජර්නල් 03 ක් ප්‍රකාශයට පත් කිරීම සිදුකල යුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය සතු වාහනය හා යුනිසෙෆ් ආයතනය මගින් ආයතනය වෙත පරිත්‍යාග කරන ලද වාහනය ආයතනය වෙත පවරා ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) මැලේසියාවේ විද්‍යා හා කළමනාකරණ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා වැටුප් සහිත වර්ෂ 02 ක් සහ වැටුප් රහිත වර්ෂයක් ඇතුළුව වර්ෂ 03 ක කාලයකට නිලධාරීන් 04 දෙනෙකු හා කොළඹ ඉගෙනුම් මධ්‍යස්ථානයේ අධ්‍යාපනය හැදෑරීම සඳහා නිලධාරීන් 06 දෙනෙකු ඇතුළුව නිලධාරීන් 10 දෙනෙකු වෙනුවෙන් පාඨමාලා ගාස්තු ලෙස රු.24,593,922 ක් ගෙවා තිබුණි. කොළඹ ඉගෙනුම් මධ්‍යස්ථානයේ අධ්‍යාපනය හදාරන නිලධාරීන් ආයතනයට දින කිහිපයක් සේවයට වාර්තා කර ඇති අතර කොළඹ ඉගෙනුම් මධ්‍යස්ථානයේ පැමිණීමේ වාර්තා අනුව ඔවුන් 2015 ජනවාරි සිට මාර්තු දක්වා පාඨමාලාවට සහභාගි වී නොතිබුණි. එහෙත් මෙම නිලධාරීන් 10 දෙනා අදාල අධ්‍යයන කටයුතුවලට සහභාගි වී හෝ නිසි පරිදි රාජකාරියට වාර්තා කිරීමෙන් තොරව 2014 නොවැම්බර් සිට 2015 මාර්තු මාසය දක්වා රු.2,818,890 ක වැටුප් ලබාගෙන තිබුණි.

(ඇ) අධ්‍යාපන අමාත්‍යාංශය, එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) හා ශ්‍රී ලංකා රජය 2012 සැප්තැම්බර් මාසයේ එළඹී ගිවිසුමට අනුව අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික අධ්‍යාපන ආයතනය ක්‍රියා කළයුතු ආයතන වන අතර ගිවිසුමේ 8 වගන්තිය අනුව යුනෙස්කෝ ආයතනය විසින් එක් එක් ක්ෂේත්‍රවල විශේෂ වූ දැනුම් ඇතුළු තාක්ෂණ සහාය ලබාදීම සිදුකිරීමට එකඟ වී තිබුණද 15 වන වගන්තිය අනුව ගිවිසුමේ කාලය වර්ෂ 06 ක් වන අතර දැනට වර්ෂ 3 කට අධික කාලයක් ඉක්ම ගොස් තිබුණ දකුණු ආසියානු ගුරු පුහුණු මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කර නොතිබුණු අතර යුනෙස්කෝ තාක්ෂණ සහායද ලබාගෙන නොතිබුණි.

(ඇ) 2001 අගෝස්තු 13 දිනැති අංක 2/ඉඩම/බප01/1416/97 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මඟින් පවරා දුන් රු.78,600,000 ක් වටිනා හෙක්ටයාර් 7.0958 ක් වූ ඉඩම හා රු.65,000,000 ක් වටිනා බදුවත්ත ඉඩම්වල අයිතිය විධිමත්ව පවරා ගැනීමකින් තොරව ආයතනය සතු වත්කම් ලෙස හඳුනාගෙන තිබුණි.

(ඉ) 2008 වර්ෂයේදී ආයතනයේ කෙමහල් නේවාසිකාගාරයේ වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම වෙනුවෙන් රු. 27,848,100 ක ඇස්තමේන්තු සකස්කර තිබූ අතර සැලසුම් හා ඇස්තමේන්තු සකස්කිරීම සඳහා 2008 මාර්තු 14 දින උපදේශක සමාගමක් සමඟ ගිවිසුම්ගතව, උපදේශක ගාස්තු ලෙස කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 5 ක් එනම් රු. 1,200,949 ක් ගෙවා වසර 8 ක් ගතවී තිබියදීත් ඉදිකිරීම් කටයුතු 2016 ජුනි 30 දින වනවිටත් ආරම්භ කර නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

ශිෂ්‍ය තොරතුරු පද්ධතියක් සකස් කිරීමේ මූලික කටයුතු සැකසීම සඳහා රාජ්‍ය ආයතනයක් නොවන තනි පුද්ගලයෙකු සමග ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැරව 2013 ජුනි 25 සිට වසර 2 ක කාලයකදී සංවර්ධන කටයුතු අවසන් කිරීමට ගිවිසුම්ගතව 2013 ජූලි මාසයේදී රු. 140,000 ක් ගෙවා තිබුණද මෙම තොරතුරු පද්ධතිය ගිවිසුම් ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සංවර්ධනය කර නොතිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

පර්යේෂණ හා සංවර්ධන කටයුතු වෙනුවෙන් 2011 වර්ෂයේදී රු. 8,750,000 ක් වෙන්කර තිබුණද 2015 මාර්තු 31 දින වන තෙක්ම මෙම අරමුදල ප්‍රයෝජනයට ගෙන කිසිදු පර්යේෂණ ක්‍රියාවක් සිදුකර නොතිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගුරු නේවාසිකාගාර පහසුකම් සපයා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් රු.85,794,089 ක් වැයකර ඉදිකිරීම නිමකර වසරක් ගතවීමට ආසන්නව ඇති ගුරුපුහුණු මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භකර නොතිබූ අතර රු.4,814,318 ක් වටිනා කාර්යාල උපකරණ ප්‍රයෝජනයට නොගෙන වගකීම් කාලයද අවසන් වී තිබුණි.

(ආ) නිසි සැලැස්මක් අනුව පොත් මුද්‍රණ කටයුතු නොකිරීම හේතුවෙන් විෂයයන් 90 කට අදාලව රු. 5,069,146 ක වටිනාකමක් ඇති පොත් 48,160 ක් දීර්ඝ කාලයක් තිස්සේ අලෙවි නොවී විගණන දිනය වූ 2016 ජුනි 30 දක්වා ගබඩාව තුළ පවතින බව නිරීක්ෂණය විය.

## 4.6 කොන්ත්‍රාත් ක්‍රියාවලිය

ඉදිකිරීම් පිරිවැය රු.93,975,432 ක්වූ දකුණු ආසියානු ගුරු පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල 2015 මාර්තු 17 දින ආයතනයට භාරදී තිබුණද විගණනය විසින් සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී විවිධ ස්ථානවල බිත්ති පුපුරා තිබීම, ජනෙල්, දොරවල් හා ටයිල් ගැලවී තිබීම, කොන්ක්‍රීට් කණු පුපුරා තිබීම, ගොඩනැගිල්ල තුලට වතුර කාන්දුවීම ආදී විශාල අඩුපාඩු රාශියක් නිරීක්ෂණය වූ අතර මෙහිදී ඉදිකිරීම් වල ශක්තිමත්භාවය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 22 දිනැති අංක DMS/B1/37/3/Vol 111 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය පරිදි අනුමත කාර්ය මණ්ඩලය 652 ක් වූ අතර සත්‍ය කාර්ය මණ්ඩලය 455 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 197 ක් පුරප්පාඩු වී තිබුණි. එම පුරප්පාඩු තුළ ආයතනයේ ඉහළ කළමනාකරණයට අයත් තනතුරු සංඛ්‍යාව 119 ක් වූ අතර ඉන් 100 ක් කථිකාචාර්යවරුන් වීම හා වැඩ ආවරණ තනතුරු 13 ක් වීම හේතුවෙන් ඇයේ

දරුවනට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සඳහා වන කාර්යභාරයේදී විෂය මාලා සංවර්ධනය ඇතුළු ආයතනයට පැවරී ඇති වගකීම් නිසි ලෙස ඉටුකිරීමට ඇති හැකියාව ගැටළු සහිත බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් පුරප්පාඩු 95 ක් පිරවීම සඳහා අවස්ථා 3 කදී රු. 267,731 ක වියදමක් දරා පුවත්පත් දැන්වීම් පලකර තිබුණද එම එකදු පුරප්පාඩුවක් හෝ සමාලෝචිත වර්ෂයේදී පිරවීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ඇ) ආයතනයේ සංවිධාන සටහන අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් තනතුරු 5 කින් සමන්විත වුවද ඉන් තනතුරු 3 ක්ම පුරප්පාඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදීද එම තනතුරු පිරවීමට කටයුතු කිරීමකින් තොරව ද්විතියන හා අනුයුක්ත පදනම මත තාවකාලික නිලධාරීන් පත්කර තිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට ආයතනයේ වැඩ බලන අධ්‍යක්ෂකවරු 5 දෙනෙකු පත් කර රු. 154,120 ක දීමනා ගෙවා තිබුණු අතර දෙපාර්තමේන්තු අටක ප්‍රධානීන් 8 දෙනෙකු සඳහා වැඩ බැලීමේ පත්වීම් ලබාදී තිබුණි.

(ඉ) සහකාර කථිකාචාර්ය තනතුරු 2 ක් සඳහා 2011 ජූනි 01 දින හා 2013 දෙසැම්බර් 01 දින අනියම් හා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවාගෙන සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු. 3,181,505 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ඊ) අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව අධ්‍යක්ෂක (මුද්‍රණ) තනතුරක වැඩ බැලීම සඳහා මාසිකව රු.9,632 ක වැඩ බැලීමේ වැටුපක් ගෙවීමේ පදනම මත 2015 ඔක්තෝබර් 29 දින සිට නිලධාරියෙකු සේවයේ යොදවාගෙන තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත වියදම්, සත්‍ය වියදම් සමඟ සැසඳීමේදී සියයට 24 සිට සියයට 1647 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5.2 නොවිසඳී ඇති විගණන ඡේද

2009 ජූනි 01 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ (I) හා (II) ප්‍රකාරව ආයතනයේ මාණ්ඩලික ශ්‍රේණි හැර අනෙකුත් නිලධාරීන්ගේ වැටුප් පරිවර්තනය කිරීමේදී නිලධාරීන් 29 දෙනෙකු සඳහා 2009 ජනවාරි 01 සිට 2014 අප්‍රේල් 30 දක්වා රු. 1,209,220 ක වැටුපක් වැඩිපුර ගෙවා තිබූ අතර ඒ මත රු. 156,684 ක සේවක අර්ථ සාධක මුදල් ප්‍රේෂණය කර තිබූ බව ඉකුත් වර්ෂයේ වාර්තාවෙන් පෙන්වාදී තිබුණද මෙතෙක් එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩු නොපිරවීම, දීර්ඝ කාලයක් වැඩ බැලීමේ වැටුප් ගෙවීම. |
| (ආ) | විදේශ හා දේශීය පුහුණුවීම් | විධිමත් ආකාරයට නිලධාරීන් තෝරා නොගැනීම හා අනුමැතියකින් තොරව දීමනා ගෙවීම. |
| (ඇ) | වාහන පාලනය | වාහන පවරා නොගැනීම. |
| (ඈ) | කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | අදාල නීතිරීති වලට අනුකූලව කටයුතු නොකිරීම. |
| (ඉ) | තොග පාලනය | යල් පැනගිය හා අක්‍රිය තොග සම්බන්ධ ක්‍රියාමාර්ග නොගැනීම හා පොත්පත් යාවත්කාලීන නොකිරීම. |
| (ඊ) | ස්ථාවර වත්කම් පාලනය | ආයතනයට අයත් ඉඩම්, වාහන නිසි පරිදි පවරා නොගැනීම හා ඌන උපයෝජිත වත්කම් ඵලදායී ලෙස යොදා නොගැනීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

### 5.2 නොවිසඳී ඇති විගණන ඡේද

2009 ජූනි 01 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ (I) හා (II) ප්‍රකාරව ආයතනයේ මාණ්ඩලික ශ්‍රේණි හැර අනෙකුත් නිලධාරීන්ගේ වැටුප් පරිවර්තනය කිරීමේදී නිලධාරීන් 29 දෙනෙකු සඳහා 2009 ජනවාරි 01 සිට 2014 අප්‍රේල් 30 දක්වා රු. 1,209,220 ක වැටුපක් වැඩිපුර ගෙවා තිබූ අතර ඒ මත රු. 156,684 ක සේවක අර්ථ සාධක මුදල් ප්‍රේෂණය කර තිබූ බව ඉකුත් වර්ෂයේ වාර්තාවෙන් පෙන්වාදී තිබුණද මෙතෙක් එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

### 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩු නොපිරවීම, දීර්ඝ කාලයක් වැඩ බැලීමේ වැටුප් ගෙවීම. |
| (ආ) | විදේශ හා දේශීය පුහුණුවීම් | විධිමත් ආකාරයට නිලධාරීන් තෝරා නොගැනීම හා අනුමැතියකින් තොරව දීමනා ගෙවීම. |
| (ඇ) | වාහන පාලනය | වාහන පවරා නොගැනීම. |
| (ඈ) | කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | අදාල නීතිරීති වලට අනුකූලව කටයුතු නොකිරීම. |
| (ඉ) | තොග පාලනය | යල් පැනගිය හා අක්‍රිය තොග සම්බන්ධ ක්‍රියාමාර්ග නොගැනීම හා පොත්පත් යාවත්කාලීන නොකිරීම. |
| (ඊ) | ස්ථාවර වත්කම් පාලනය | ආයතනයට අයත් ඉඩම්, වාහන නිසි පරිදි පවරා නොගැනීම හා ඌන උපයෝජිත වත්කම් ඵලදායී ලෙස යොදා නොගැනීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

ජාතික අධ්‍යාපන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

පැහැදිලි කිරීම :

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පිළිගනිමි.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ප්‍රකාරව කටයුතු කිරීමට සූදානම් කර ඇත.

මේ අනුව 2016. 12. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පිළිගනිමි.

2016 ගිණුම් වර්ෂයේ සිට විගණන වාර්තාවේ සඳහන් පරිදි කටයුතු කිරීමට මුදල් අංශයේ නිලධාරීන් දැනුවත් කිරීමට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන, මුදල් හා සහාය සේවා) වෙත උපදෙස් ලබා දී ඇත.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

61-6298 හා GV-1823 වාහන දෙක UNDP ආයතනය වෙත භාරදීමට අවශ්‍ය කටයුතු කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී තිබුණි.

ඒ අනුව 2016.11.15 දින UNDP ආයතනයේ නේවාසික නියෝජිත අමතමින් මෙම වාහන පවරා දීමේ අවශ්‍යතාව පිළිබඳ ව දන්වා සිටින ලදී. මෙම ලිපියට පිළිතුරක් ලෙස 2016 නොවැම්බර් 17 දිනැති, දිවයිනේ සියලුම ආයතන ආවරණය වන පරිදි යැවූ ලිපියක් මගින් ජාතික අධ්‍යාපන ආයතනයේ දැනට භාවිත කරන 61-6298 හා GV-1823 දරණ වාහන අදාල බදු ගෙවා ආයතනයට ලබා ගන්නා ලෙස UNDP ආයතනය මගින් දන්වා ඇත. (ඇමුණුම 01)

2016 නොවැම්බර් 15 දිනැති ලිපියට UNDP ආයතනය මගින් ප්‍රතිචාර දක්වා නොමැති බැවින් නැවත සිහිකැඳවීම් ලිපියක් යැවීමට කටයුතු කරනු ලැබේ.

2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

මේ පිළිබඳ ව මූලික පරීක්ෂණයක් පැවැත්වීමට ත්‍රිත්ව පුද්ගල කමිටුවක් 2016. 09. 21 දින පත් කර ඇත. මේ සම්බන්ධ ව පරීක්ෂණයක් සිදු කර සති තුනකින් වාර්තා කරන බව නීති නිලධාරි විසින් 2016.10.10 දින විගණන හා කළමනාකරණ කමිටුවට දැනුම් දෙන ලදී. අදාළ වාර්තාව මේ වන විට ලබා දී ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත ය.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) මෙම මුදල පාඩුවක් ලෙස ලියා හැරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය හා එක් ව අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට මුදල් අංශයේ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

(ආ) මෙම මුදල්වලට අදාළ ව 2016 නොවැම්බර් 30 දිනට පෙර ප්‍රතිචාර දක්වන ලෙස අදාළ පාර්ශව වෙත ලිපි යොමු කර ඇත. එදිනට ප්‍රතිචාර නොදැක්වූ අයගේ මුදල් 2016 වර්ෂයේ ගිණුම්වල ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල් නොවීම

(අ) <u>2015 මාර්තු 10 දිනැති අංක 03/2014(1) දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය</u>

2015.07.02 දිනැතිව නිකුත් කරන ලද අංක 452(1) දරණ පාලන චක්‍රලේඛය 2016.10.20 දින පැවැත්වූ අංක : 407 ආයතන සභාවේ දී ගනු ලැබූ තීරණය අනුව අවලංගු කර ඇත. එම ආයතන සභා තීරණය අනුව 2016 ඔක්තෝබර් 01 දින සිට රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක :PED/02/2015 අනුව ජාතික අධ්‍යාපන ආයතනයේ අදාළ නිලධාරීන්ගේ සන්නිවේදන පහසුකම්වලට අදාළ බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර ඇත.

එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල් හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන මුදල් හා සහාය සේවා) දැනට ආයතන සේවයේ නොමැති බැවින් වැඩිපුර ගෙවා ඇති එම මුදල් අත්හැරීම් ලෙස සැලකීමට ආයතන සභාව විසින් තීරණය කරන ලදී.

(ආ) <u>2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9.7 හා 9.8 ඡේද</u>

මෙම ගෙවීමට අදාළ ව මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා 2016.08.09 දින ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය ඉල්ලා ලිපියක් ඉදිරිපත් කරන ලද අතර 2016.11.21 දින ඔවුන් විසින් කරන ලද කරුණු විමසීමකට 2016.12.08 දින පිළිතුරු යවන ලදී. (ඇමුණුම - 02 )

ප්‍රතිචාරයක් නොලද බැවින් නැවත සිහිකැඳවීම් ලිපියක් යොමු කිරීමට උපදෙස් දී ඇත.

(ඇ) <u>2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 8.9.1 (ආ) වගන්තිය</u>

රු. 500,000/- ඉක්මවන මිල දී ගැනීම් කටයුතුවල දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) වගන්තිය අනුව ලිඛිත ගිවිසුම් අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව මිල දී ගැනීම්වල දී ලිඛිත ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) <u>2010 සැප්තැම්බර් 06 දිනැති ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ අතිරේක 9.3.1 (ආ) ඡේදය</u>

විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දුන් කරුණු අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1(ආ) වගන්තිය ප්‍රකාරව රු. 200,000/- වඩා වැඩි වන මෝටර් වාහන හා උපකරණ අලුත්වැඩියා කිරීම් වියදම් සම්බන්ධයෙන් අධ්‍යාපන ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට පියවර ගෙන ඇත.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල
පිළිගනිමි.

3.2 දායකත්වය
පිළිගනිමි.

3.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
පිළිගනිමි.

3.4 ආයතනයට එරෙහි ව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

(අ) 1. ඇන්ටන් රවීන්ද්‍ර කුමාර මහතාගේ නඩුව

මෙම නඩුවේ 2 වන විත්තිකාරියට එරෙහි ව ලබා දී ඇති තීන්දුව අධිකරණයේ පිස්කල් මගින් යොමු කළ ද 2 වන විත්තිකාරිය එම ලිපිනයේ නොමැති බවට වාර්තා කර ඇත. මේ පිළිබඳ කඩවත පොලිසිය මගින් සොයා බැලූ අතර ඇය එම ලිපිනයේ පදිංචි ව නොමැති බවට වාර්තා කර ඇත.

1. **එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මියගේ නඩුව**

මෙම නඩුවේ විත්තිකරුවන් තිදෙනා විදේශගත වී ඇති බැවින් ඔවුන්ගේ නිවැරදි ලිපිනය සොයා ගත නොහැකි බැවින් නඩුව තාවකාලික ව බහා තබා ඇත.

3. **බී. කේ. විජේගුණවර්ධන මියගේ නඩුව**

ඇයට එරෙහි ව නඩු පැවරීමට කටයුතු කර ඇත.

4. **කේ. ඩබ්ලිව්.පී. ඒ. වීරවර්ධන මියගේ නඩුව**

ඇයට එරෙහිව නුගේගොඩ දිසා අධිකරණය හමුවේ අංක 2320/16/M නඩුව පවරා ඇත. මෙම නඩුව දැනට විභාග වෙමින් පවතී.

5. **ඒ. පී. එස්. එස්. පතිරණ මියගේ නඩුව**

මෙම නඩුව දැනට විභාග වෙමින් පවතී.

6. **එස්. එම්. සේනානායක මයාගේ නඩුව.**

මෙම නිලධාරියාට එරෙහිව නුගේගොඩ දිසා අධිකරණය හමුවේ අංක 669/08/M නඩුව පවරා තිබුණි.

මෙම නඩුව 2013. 08. 06 දින කැඳවූ අවස්ථාවේ දී මෙම නිලධාරියා එම මුදල වසර 05 ඇතුළත (වාරික 60 කින්) ගෙවා පියවන බවට අධිකරණය හමුවේ සමථයක් සඳහා යෝජනා කරන ලදී. නඩුව අවසන් වී ඇත.

ඒ අනුව 2013. 10. 30 දින පැවති එකඟතාව පරිදි එස්. එම්. සේනානායක මහතා විසින් 2013. 12. 18 දින සිට 2016.12.19 දින දක්වා රු. 540,345.41 ක මුදලක් ආයතනය වෙත ගෙවා ඇත. (රු. 14,603/93 x වාරික 37) මුල් වාරිකය හා අවසන් වාරිකය සඳහා ගෙවා ඇති ලදුපත්වල පිටපත් අමුණා ඇත (ඇමුණුම 03).

(ආ) නිලධාරීන් හතර දෙනෙකු විසින් ආයතනයට එරෙහි ව නඩු හතරක් පවරා තිබුණි.

**කම්කරු විනිශ්චය සභාව - බී. ආර්. එම්. දයානන්ද**

මොහු විසින් සිදුකර ඇති රු. 36,000/- මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඒ අනුව වැරදිකරු වීම මත සේවයෙන් පහකර ඇත.

මොහු අංක : MH/33/208/04 දරන නඩුව ආයතනයට එරෙහිව පවරා තිබුණි.

මෙම නඩුවේ ඉල්ලුම්කරු වන බී. ආර්. එම්. දයානන්ද මයා නිදොස් කර ඇති අතර ඔහු නැවත සේවයේ පිහිටුවීමට අධිකරණය නියෝග කර ඇත. ඒ අනුව සේවයේ පිහිටුවා වන්දි ගෙවීම සිදු කර ඇත.

**එම්.කේ. ඩී. දේශප්‍රිය**

මොහු කම්කරු විනිශ්චය සභාවේ MH33/1179/14 - නඩුව පවරා තිබුණි.

මේ පිළිබඳව ඇති කර ගන්නා ලද සමථයක් අනුව ජාතික අධ්‍යාපන ආයතනයේ 2015. 07. 13 දින පැවති 398 වන ආයතන සභා රැස්වීමේ අනුමැතිය මත 2015. 08. 04 දින සිට මොහු සේවයේ පිහිටුවීමටත්, අදාළ සම්පූර්ණ කාලයට වැටුප් ගෙවීමටත් කටයුතු කර ඇත.

**නිල්මිණි වික්‍රමසිංහ**

ජාතික අධ්‍යාපන ආයතනයේ පොත්හලේ දෛනික විකුණුම්වලින් 2009 වර්ෂය තුළ රු. 549,772.50 ක මුදලක් පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගැනීම සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා එහි තීරණය මත වරදකරු වූයෙන් සේවයෙන් පහකර ඇත.
ඇය අංක MH33/1005/11 දරන නඩුව ආයතනයට එරෙහිව පවරා ඇත.

**වර්තමාන තත්ත්වය :**

මෙම නඩුව දැනට විභාග වෙමින් පවතී.

**WP/HCCA/MT/12/2012 RA - සිවිල් මහාධිකරණය, ගල්කිස්ස කේ.ඩී.එල්.රානි මිය**

ජාතික අධ්‍යාපන ආයතනය මඟින් මෙහෙයවන ලද දූරස්ථ ගුරු පුහුණු පාඨමාලා නිසි පරිදි සම්පූර්ණ කර නොමැති හෙයින් පාඨමාලා සහතිකයට හිමිකම් නොලැබූ බැවින් එය ලබා ගැනීම සඳහා ආයතනයට එරෙහිව අභියාචනාධිකරණය හමුවේ අංක 11/2007 දරන නඩුව පැවරූ අතර එහි ඇයගේ පෙත්සම නිශ්ප්‍රභා කෙරිනි. නැවත ඇය එම කාරණය නුගේගොඩ දිසා අධිකරණය, හමුවේ අංක SPL/125/09 දරන නඩුව පැවරූ අතර එම නඩුව ද නිශ්ප්‍රභා කෙරිණි.

ඇය නැවත මේ පිළිබඳව ගල්කිස්ස සිවිල් අභියාචන මහාධිකරණය හමුවේ ඉහත අංක යටතේ නඩුව පවරා ඇත.

**වර්තමාන තත්ත්වය :**

මෙම නඩුව දැනට විභාග වෙමින් පවතී. මෙම නඩුවේ මීළඟ විභාග දිනය 2017.01.25 දින වේ.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් පුහුණුකරුවන් 120ක් පුහුණු කර ඇති අතර ඉතිරි පළාත්වල 477ක් පුහුණු කර ඇත. මේ අනුව 597ක් පුහුණු කර ඇත.

(ආ) ප්‍රාථමික අධ්‍යාපන අවධියට අදාළ ව දියත් කරනු ලැබූ ළමා සංවර්ධන ප්‍රමිති පර්යේෂණයේ පර්යේෂණ වාර්තාව 2016.11.10 දිනට පීඨය භාර නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත භාර දී ඇත.

(ඇ) තත්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව 24 කි. එම සිසුන් 24 දෙනාගේ පර්යේෂණ මාතෘකා අනුමත කොට ඇගයීම් සිදු කර එම ලකුණු විභාග දෙපාර්තමේන්තුව වෙත භාර දී අදාළ කාර්යය අවසන් කර ඇත.

පාඨමාලාව සඳහා පැමිණ ඇත්තේ 14 දෙනෙකු පමණි. දෙදෙනෙකු පාඨමාලාව හැදෑරීමට පැමිණ නැත. මේ අනුව පැමිණි 14 දෙනාගේ ව්‍යාපෘති වාර්තා 14 ඇගයීම් කර ලකුණු විභාග දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත. මේ අනුව ඉලක්කගත කාර්යය 100% කින් නිම කර ඇත.

(ඇ) මෙම වසරේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ලිපි නොලැබීම නිසා මෙම පර්යේෂණ සඟරා තුන ප්‍රකාශයට පත් කිරීමට නොහැකි වූ අතර පර්යේෂණ අනාවරණ සම්මන්ත්‍රණයෙන් ලබා ගත් ලිපිවලින් සඟරා 3ක් නිකුත් කිරීමට බලාපොරොත්තු වේ.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) විගණන වාර්තාවේ 2.2.3 යටතේ දක්වා තිබූ කරුණු මෙයටද අදාළ වේ.

NA-7574 වාහනය ජාතික අධ්‍යාපන ආයතනය වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය වෙත 2016.02.11 දින හා 2016.10.06 දින ලිපි යොමු කර ඇත.

(ආ) මෙම පාඨමාලාවේ අධ්‍යයන කටයුතු ක්‍රමවේදය මූලික වශයෙන් දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය අනුව සිදුවේ.

එහෙයින් අදාළ පාඨමාලාවේ පාඨමාලාලාභීන්ගේ අධ්‍යයන කටයුතු, නිවෙස්වල සිට සිදු කිරීම සම්බන්ධ ව අදාළ විශ්ව විද්‍යාලය වෙතින් තහවුරු කර ගැනීමට අධ්‍යක්ෂ (බාහිර සබඳතා) වෙත උපදෙස් දෙන ලද අතර ඉන් ලැබෙන විස්තර අනුව ඉදිරි පියවර ගනු ලැබේ.

(ඇ) පාලක සභාවට යුනෙස්කෝ සාමාජික රටවල නියෝජිතයන් හා ශ්‍රී ලංකා නියෝජිතයන් පත් කිරීම පිළිබඳ ව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ජ්‍යෙෂ්ඨ කළමනාකරණ රැස්වීම්වල දී අවධානය යොමු කරවන ලද අතර, මේ වන විට පත්කිරීම් සිදු කර ඇත. පාලක සභාවේ ප්‍රථම රැස්වීම 2017 මාර්තු මාසයේ දී පැවැත්වීමට කටයුතු කරන බව අධ්‍යාපන අමාත්‍යාංශයෙන් දැනුම් දී ඇත. අධ්‍යක්ෂවරයකු හා උපදේශකවරයකු පත් කිරීමෙන් පසු මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කෙරෙනු ඇත.

(ඈ) මහරගම හා පාදුක්ක ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත අවශ්‍ය විස්තර සපයා ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන, මුදල් හා සහාය සේවා) වෙත උපදෙස් ලබා දෙන ලදී.

ඒ අනුව මහරගම ප්‍රාදේශීය ලේකම් විසින් 2016.11.23 දිනැතිව අධ්‍යාපන ලේකම් වෙත යොමු කර තිබූ ලිපිය අනුව විශේෂ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මගින් මෙම ඉඩම පවරා ගැනීමට කටයුතු කරන ලෙස දැනුම් දී ඇත. මේ අනුව 2016.12.16 දිනැතිව අධ්‍යාපන ලේකම් වෙත ලිපියක් මගින් ඒ පිළිබඳ අවශ්‍ය කටයුතු කරන මෙන් ඉල්ලීම් කර ඇත. (ඇමුණුම-4)

මීපේ පරිශ්‍රයේ පිහිටි ඉඩම සම්බන්ධයෙන් පාදුක්ක ප්‍රදේශීය ලේකම් විසින් මෙම ඉඩමේ ගැසට් නිවේදනයේ පිටපතක් ඉල්ලා තිබූ බැවින් එය ඉදිරිපත් කරන ලදී. (ඇමුණුම-5)

(ඉ) නෙමහල් නේවාසිකාගාරයේ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම් කටයුතු සඳහා මහා භාණ්ඩාගාරයෙන් අදාළ ප්‍රතිපාදන ලබා නොදීම නිසා ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමේ හැකියාවක් නොමැත.

## 4.3 මතභේදයට තුඩු දෙන ගැටලු

මේ සම්බන්ධව ඩී. එම්. එන්. ජේ. දිසානායක මහතා වෙත 2016. 09. 14 දින එන්තරවාසියක් යොමු කර ඇත. ඒ අනුව ඩී. එම්. ජේ. දිසානායක මහතා විසින් 2016.10.11 දින රු. 140,000 ක මුදල ආයතනයට ආපසු ගෙවා ඇත (ඇමුණුම-6).

## 4.4 අරමුදල් ඌණ උපයෝජනය

මෙම ප්‍රතිපාදන මුදල් යොදා ගැනීම සඳහා වූ යෝජනාව ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කර ඇත.

## 4.5 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

(අ) මාලදිවයින් විදුහල්පතිවරුන් සහ අධ්‍යාපනඥයන් කණ්ඩායම් තුනක් සඳහා දැනට පාඨමාලා පැවැත්වීමට කටයුතු කර ඇති අතර, ඉදිරියේ දී සංවිධානය කරනු ලබන පාඨමාලා මගින් මෙම ගොඩනැගිල්ල හා අදාළ උපකරණ භාවිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

(ආ) මින් ඉදිරියට සැලසුම් සහගත ව ක්‍රියාත්මක වීමටත් ගොඩ ගැසී ඇති පොත් හා කැසට් පට නිසි ලෙස බෙදා හැරීමටත් කටයුතු කරනු ලැබේ.

4.6 කොන්ත්‍රාත් ක්‍රියාවලිය

ඉදිකිරීම්වල තිබූ අඩුපාඩු කොන්ත්‍රාත්කරු විසින් සම්පූර්ණ කර දී ඇත. උපදේශක සේවා ආයතනය වෙතින් අදාළ සහතිකය ලබා ගෙන ඇත.

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) 2016 වර්ෂයේ දී තනතුරු 110ක පුරප්පාඩු පිරවීම අනුමත කර දෙන ලෙස 2016.09.23 දින දරණ ලිපියෙන් ඉල්ලා සිටින ලද අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් තනතුරු 79ක පුරප්පාඩු පිරවීමට 2016.09.30 දින අනුමැතිය ලබා දුනි. අනුමත කරන ලද අධ්‍යක්ෂ තනතුරු 09න් 02ක් 2016.12.01 දින පුරවන ලද අතර තවත් තනතුරු 3කට සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් වී ඇත. ඉතිරි තනතුරු 04 සඳහා අයදුම්පත් කැඳවීමට කටයුතු සැලසුම් කර ඇත (ඇමුණුම-7)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු 21ක් සඳහා අභ්‍යන්තර ඉල්ලුම් පත්‍ර කැඳවන ලද අතර ඉල්ලුම් පත්‍ර 46ක් ලැබී ඇත. මේ පිළිබඳ ව සම්මුඛ පරීක්ෂණ 2017 ජනවාරි 16 දින පැවැත්වීමට නියමිත අතර, කථිකාචාර්ය තනතුරු සඳහා අභ්‍යන්තරික ව අයදුම්පත් කැඳවීමට කටයුතු සැලසුම් කර ඇත. සහකාර කථිකාචාර්ය තනතුරු 25ක් පිරවීමට අනුමැතිය ලැබී ඇති අතර ඒ සඳහා පළකරන ලද පුවත්පත් දැන්වීමට ඉල්ලුම් පත්‍ර 3643 ක් ලැබී තිබුණි. 2017 ජනවාරි මාසය තුළ මෙම සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත.

(ආ) ඉහත පිළිතුර ම අදාළ වේ.

(ඇ) පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දීම ප්‍රමාද වන විට ආයතනයේ පුරප්පාඩුව පවතින ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරුවලට අධ්‍යාපන ලේකම්තුමා විසින් වරින් වර අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් අනුයුක්ත කිරීම සිදු වී ඇත. දැනට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් දෙදෙනෙකුගේ පුරප්පාඩු පිරවීමට අනුමැතිය ලබා දී ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

(ඈ) පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ (මුදල්) හා අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) තනතුරු සඳහා 2016.12.01 දින සිට නව පත්වීම් ලබා දී ඇත.

අධ්‍යක්ෂවරුන් තුන් දෙනෙකුට අදාළ සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් වී ඇත. අංශ ප්‍රධානී තනතුරු අදාල අංශවල කටයුතු සමායෝජනය කිරීම සඳහා එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දී ඇති අතර, මේ සම්බන්ධව කිසිදු අමතර ගෙවීමක් සිදු නොකෙරේ.

(ඉ) සහකාර කථිකාචාර්ය තනතුරු 25ක් පිරවීමට අනුමැතිය ලැබී ඇති අතර, මේ සඳහා පළකරන ලද පුවත්පත් දැන්වීමට ඉල්ලුම් පත්‍ර 3643ක් ලැබී තිබුණි. 2017 ජනවාරි මාසයේ දී මෙම සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත.

(ඊ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය අනුව කටයුතු කරනු ලැබේ.

5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

5.1 අයවැය ලේඛනමය පාලනය

අයවැය ඇස්තමේන්තු සැකසීමේ දී වැය අයිතම අර්ථ දක්වා ඇත්තේ මහා භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව ය. මෙම අර්ථ දැක්වීම හා ආයතනයේ මූල්‍ය වාර්තාවේ වර්ගීකරණය අතර වෙනසක් පවතින බැවින් විගණනයට නිවැරදි ව තොරතුරු වාර්තා වී නැත. එබැවින් අධික විචලනයක් දක්වා ඇත.

විගණන වාර්තාවේ සඳහන් කර ඇති 24% සිට 1647% දක්වා විචලනයන්වලට අදාළ ව විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද පැහැදිලි කිරීමේ විස්තරය ඇමුණුම් අංක 8 මගින් ඉදිරිපත් කර ඇත.

ආයතනයේ සැලසුම්, අය-වැය ඇස්තමේන්තු හා සත්‍ය වියදම් මාසික ව නියාමනය කරමින් ආයතනයේ ඵලදායිත්වය හා කාර්යක්ෂමතාව වැඩි කිරීමට සැලසුම්, මුදල් හා අභ්‍යන්තර විගණන අංශවල නිලධාරීන්ගෙන් සමන්විත අභ්‍යන්තර මූල්‍ය කළමනාකරණ කමිටුවක් පිහිටුවා ඒ අනුව මාසික ව මූල්‍ය ප්‍රගතිය ඇගයීමට හා වාර්තා කිරීමටත්, නිවැරදි කළ යුතු තැන් නිවැරදි කර යහපත් මූල්‍ය පාලනයක් පවත්වා ගැනීමටත්, සාර්ථක භෞතික ප්‍රගතියක් ලබා ගැනීමටත් මේ වන විට කටයුතු යොදා ඇත.

5.2 නොවිසඳී ඇති විගණන ඡේද

මෑතක දී විශ්‍රාම ගිය හා ඉවත් වූ සේවකයන්ගේ පාර්තෝෂික දීමනා ගෙවන විට වැඩිපුර ගෙවූ වැටුප අය කර ගැනීම සඳහා අදාළ පාර්තෝෂික දීමනා මුදලින් ගණනය කරන ලද මුදල අඩු කර ගෙන ඉතිරි මුදල් ගෙවා ඇත.

සේවයෙන් ඉවත් වන සේවකයන්ට අවසන් ගෙවීම් සිදු කිරීමේ දී වැඩිපුර ගෙවා තිබූ වැටුප් අඩු කර ගෙන ගෙවීම් සිදු කර ගෙන ඇත.

සේවක අර්ථසාධක අරමුදල් වැඩිපුර ගෙවා තිබූ විශ්‍රාම ගිය නිලධාරී වෙත මුදල් ආපසු ගෙවන ලෙස ලිපියක් 2014.10.14 දින යොමු කර ඇති අතර, ඊට ප්‍රතිචාරයක් නොවූයෙන් 2016.09.21 දින ද නැවත ලිපියක් යොමු කර ඇත.

වැඩිපුර ගෙවා ඇති මුදල් අදාළ සේවකයන්ගෙන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

6. පද්ධති හා පාලනයන්

(අ) කාර්ය මණ්ඩල පරිපාලනය

ජාතික අධ්‍යාපන ආයතනය වෙත එහි පනතින් පවරා ඇති භාරදූර කාර්යයන් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් පරිදි නොසිටීම විශාල ගැටලුවක් වන අතර නව බඳවා ගැනීම සඳහා සිදු වන නොයෙකුත් ප්‍රමාද ඉවත් කර සුදුස්සන් බඳවා ගැනීම කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී.

(ආ) විදේශ හා දේශීය පුහුණුවීම්

විදේශ හා දේශීය පුහුණුවීම් සඳහා කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධන සැලසුමකට අනුව ඉහත දී කටයුතු කර ඇතත්, පසු කලෙක එම කාර්යයන් නිසි පරිදි සිදු නොවීම ගැටලු රැසකට හේතු වී ඇත. නැවත පද්ධතිය යථා තත්ත්වයට පත් කර විධිමත් සැලසුමකට අනුව කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධන කටයුතු පවත්වා ගෙන යාමටත් අදාළ චක්‍රලේඛ අනුව අධ්‍යයන නිවාඩු ලබා දීමටත් කටයුතු කරන බව කාරුණික ව දන්වා සිටිමි.

(ඇ) වාහන පාලනය

ආයතනය, නිරන්තරයෙන් පළාත් නවය (09) සමඟ අධ්‍යාපන කටයුතුවල දී එක් ව ක්‍රියා කළ යුතු බැවින් දැනට පවතින වාහන සංචිතය විධිමත් පරිදි ගමන් සඳහා යොදා ගැනීමටත් අදාළ අලුත්වැඩියා කටයුතු චක්‍රලේඛවලට අනුකූල ව නිවැරදි ව සිදු කර පාලනය කිරීමටත් අදාළ නිලධාරින් දැනුවත් කර ඇත.

වාහන පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට නිලධාරින්ට උපදෙස් ලබා දී ඇත.

(ඇ) කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය

ආයතනයේ වාර්ෂික සැලැස්ම සකස් කරන අවස්ථාවේ දී විවිධ දෙපාර්තමේන්තුවල පවතින අවශ්‍යතා ගණනය කර ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර විධිමත් පරිදි ප්‍රසම්පාදන කටයුතු පවත්වා ගෙන යාමට කටයුතු කරනු ලැබේ.

(ඉ) තොග පාලනය

තොග පාලනය විධිමත් ව පවත්වා ගෙන යාමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.

(ඊ) ස්ථාවර වත්කම් පාලනය

ආයතනයට අයත් ඉඩම් හා වාහන නිසි පරිදි පවරා ගෙන ඵලදායි ලෙස උපයෝජනය කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

Gunasekara

ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

ඇමුණුම

# ජාතික අධ්‍යාපන ආයතනය
# தேசிய கல்வி நிறுவகம்
# NATIONAL INSTITUTE OF EDUCATION

තැ.පෙ. 21, හයිලෙවල් පාර, මහරගම
த.பெ. 21, ஹைலெவல் வீதி, மகரகம
P.O. Box 21, High Level Road, Maharagama, Sri Lanka

අපේ යොමුව:
எமது கோவை:
Our Reference: NIE/Transport/2011/GEN/20

ඔබේ යොමුව:
தங்கள் கோவை:
Your Reference:

දිනය:
திகதி:
Date: 2016.11.15

Resident Representative
United Nations Development Programme
202/204, Bullers Road
Colombo 07

Dear Sir / Madam,

**Vehicle No s 61-6298 & GV 1823**

The above vehicles have been using by National Institute of Education for the last 15 years.

As it is a property owned by UNDP there is a necessity to hand these vehicles over to you, the registered owner of these vehicles though these have been maintaining and utilizing by NIE during the last 15 years.

Due to the fact that these two vehicles are farely old and not suitable to be used at a diplomatic mission, we wish to suggest you to permit us to keep the vehicles at NIE until such time the vehicles are not suitable to run in roads, which time we can hand it over to you to discard officially from your inventories.

We would be grateful to you if you could accept this suggestion to allow us to keep the two vehicles at NIE for the use of development activities of children in Sri Lanka as the fleet of vehicles at NIE at present is not sufficient to achieve the expected goal.

17/11/2016
Jayamini Seneviratne
UNDP

Dr. (Mrs.) T.A.R.J. Gunasekara
Director General

Dr. (Mrs.) T. A. R. J. Gunasekara
Director General
National Institute of Education
Maharagama - Sri Lanka.

United Nations Development Programme

17th November 2016

Ref : UNDP/TRA/A-040_A-059

Dear Sir/Madam,

**Ref: Transfer of Vehicles under United Nations Development Programme (UNDP) Ownership**

The United Nations Development Programme (UNDP) Country Office in Sri Lanka wishes to bring to your kind attention that the following vehicle(s) have been handed over to your organization's custody for UNDP funded project activities which were carried out in the past. Our records also indicate that such vehicles are still registered in the name of the Resident Representative, UNDP and continues to be used by your organization.

The relevant registration number(s) are: 61-6298,WP GV-1823

We have officially written to you on this subject in a letter dated 11th November 2014 and is attached herewith for your reference. Further, you have also confirmed that the said vehicles are under your organization's custody and had agreed to the settlement of all applicable duties and have the vehicles transferred in your organizations favor.

However, as of November 2016 we would like to bring to your kind attention that such transfers remain pending and incomplete and the ownership remains under the United Nations Development Programme (UNDP) while the custodian of the vehicle continues to remain with your organization.

The UNDP in Sri Lanka wishes to work in close collaboration with your organization towards successful transfer of the above vehicles. We hereby attach the latest Sri Lanka Ministry of Foreign Affairs Circular (TPN No. PR/551/2016) which outlines the ***Method of Duty Calculation for the Vehicles Imported under duty Free Basis on CIF Value***. Please be guided by this circular in estimating the duties payable for the UNDP vehicle(s) currently in your custody and make the necessary arrangements for such settlements.

We hereby seek your kind assurance that such duties are settled on an urgent basis and have the vehicles transferred prior to 31st January 2017. We remain committed to assist you in the transfer formalities once such duties have been settled in full. In the event of your organizations inability for such settlements, the UNDP wishes to retain the custody of the above vehicle(s) and please notify us to the undersigned by 15th December 2016 to enable such returns back to UNDP.

Thanking you

Sincerely,

UNITED NATIONS COLOMBO - SRI LANKA

Joern Soerensen
Country Director

Director (Engineering Services)
National Institute of Education
P.O.Box 21
High Level Road
Maharagama

Attention: Mr. P.G.R.C. Piyadasa



202-204, Bauddhaloka Mawatha. Colombo 7, Sri Lanka ▪ P.O. Box 1505 ▪ Cable: UNDEVPRO COLOMBO
Tel: +94(11)2580691-8 ▪ Telex: 21210 UNDP CE ▪ Fax: +94(11)2581116 ▪ Email: registry.lk@undp.org

ඇමුණුම 02

(1067)

ජාතික අධ්‍යාපන ආයතන
தேசிய கல்வி நிறுவகம்
NATIONAL INSTITUTE OF EDU

තැ.පෙ. 21, හයිලෙවල් පාර, මහරගම
த.பெ. 21, ஹைலெவல் வீதி, மஹரகம
P.O. Box 21, High Level Road, Maharagama, Sri Lanka

අපේ යොමුව: / எமது இலக்கம்: / Our Reference: NIE/ERMU/FA/424/III

ඔබේ යොමුව: / உங்கள் இலக்கம்: / Your Reference:

දිනය: / திகதி: / Date: 09.08.2016

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය මගින්,

ලේකම්

මුදල් අමාත්‍යාංශය,

මහලේකම් කාර්යාලය,

කොළඹ 01.

## දර්ශනශූර් උපාධි පාඨමාලාව හදාරන නිලධාරීන්ට මාසික අධ්‍යයන දීමනාව ගෙවීමට අනුමැතිය ලබා ගැනීම

ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් දස දෙනෙකු මැලේසියාවේ විද්‍යා හා කළමනාකරණ විශ්ව විද්‍යාලයේ දර්ශනශූර් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2014 වසරේ තෝරා ගන්නා ලදී.

තේරී පත් වූ නිලධාරීන් හතර දෙනෙකු මැලේසියාවේ විද්‍යා හා කළමනාකරණ විශ්ව විද්‍යාලයේ දර්ශනශූර් උපාධි පාඨමාලාව හදාරමින් සිටියි.

අනෙකුත් නිලධාරීන් 06 දෙනා කොළඹ කොල්ලුපිටියේ පිහිටි විද්‍යා සහ කළමනාකරණ විශ්ව විද්‍යාලයට අනුබද්ධ (කොළඹ පිහිටි අධ්‍යාපන මධ්‍යස්ථානයේ) (City Campus) සිට දර්ශනශූර් උපාධි පාඨමාලාව හදාරමින් සිටියි.

මැලේසියාවේ විද්‍යා හා කළමනාකරණ විද්‍යාලයේ දර්ශනශූර් උපාධිය හදාරන නිලධාරීන් 04 දෙනා සඳහා සියලුම වියදම් වසර 02 ක් සඳහා අයවැය ඇස්තමේන්තුව අනුව අදාළ විශ්ව විද්‍යාලයට ජාතික අධ්‍යාපන ආයතනය විසින් බැර කරන ලදී.

ලංකාවේ කොළඹ City Campus සිට අධ්‍යයන කටයුතුවල නිරත වන නිලධාරීන් 06 දෙනා සඳහා අයවැය ඇස්තමේන්තුව අනුව

01. අයදුම්පත් ගාස්තු
02. ලියාපදිංචි ගාස්තු
03. පාඨමාලා ගාස්තු
04. නිබන්ධන හා විභාග ගාස්තු



දුරකථන / தொலைபேசி / Telephone (+94) 011 7601601 | ෆැක්ස් / பெக்ஸ் / Fax (011) 7601800 (011) 7601700 | වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.nie.lk | ඊ-මේල් / ஈ-மெயில் / E-mail info@nie.lk

1066

විද්‍යා හා කළමනාකරණ විශ්ව විද්‍යාලයට ජාතික අධ්‍යාපන ආයතනය විසින් බැර කරන ලදී. මාසික අධ්‍යයන වියදම් දීමනාව එම නිලධාරීන් 06 දෙනාට මාසිකව US $ 150 බැගින් ලබා දෙන ලදී. එම නිලධාරීන් 06 දෙනා සඳහා මාසික අධ්‍යයන වියදම් දීමනාව අයවැය ඇස්මේන්තුවට ඇතුළත් කර ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාව විසින් අනුමත කර ඇති අතර ආයතන සභාවේ සභාපති වන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා ය. (ඇමුණුම 1 - a, 1 - b, 1 - c, 1 - d, 1 - e, 1 - f) මෙම වැඩසටහන සඳහා මුදල් ලබා දෙන ලෝක බැංකු ව්‍යාපෘතියෙන් විරෝධතාවක් නොමැති බැවින් (No Objection) ලබාගෙන ගෙවීම් සිදු කර ඇත. (ඇමුණුම 2)

එහෙත් විගණකාධිපති දෙපාර්තමේන්තුව මඟින් EDU/C/NIE/01/2015/07 දරන 2016 පෙබරවාරි 09 දින විගණන විමසුම මඟින් පි ර බී අංක 12 හා 2013 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 හා 9.8 ජේද අනුව යම් දීමනාවක් ලබා දීමේ දී මුදල් අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගත යුතු බව සඳහන් කර ඇත.

මෙම විගණන විමසුම නිසා මෙම නිලධාරීන් 06 දෙනාගේ මාසික අධ්‍යයන දීමනාව 2016 ජනවාරි මස සිට ගෙවීම් ආයතනය විසින් නතර කර ඇත.

ආයතනය විසින් ලබා දුන් මාසික අධ්‍යයන වියදම වැය කොට ඇත්තේ පහත සඳහන් වියදම් දැරීම සඳහා ය.

01. දත්ත රැස් කිරීම.
    (ප්‍රශ්නාවලි සකස් කිරීම සහ මුද්‍රණය, ප්‍රශ්නාවලි බෙදා හැරීම, සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, දත්ත රැස් කිරීම.)
02. අවසන් පරීක්ෂණයට පෙර මැලේසියාවේ සිටින උපදේශකවරුන් හමු වී උපදෙස් ලබා ගැනීම.
03. අවසන් පරීක්ෂණයට පෙර පර්යේෂණ පත්‍රිකා පිළිගත් අන්තර් ජාතික සඟරා වල පළ කිරීම.
    (අවම වශයෙන් පත්‍රිකා 3 ක් පල කළ යුතු අතර එක් පත්‍රිකාවක් සඳහා අවම වශයෙන් ඇමරිකානු ඩොලර් 100 ක් පමණ වැය වන අතර මෙම මුදල පළ කරනු ලබන සඟරාවට අනුව වෙනස් වේ.)
04. පර්යේෂණ වාර්තාවේ සෝදුපත් පරීක්ෂාව සඳහා විශ්ව විද්‍යාලය මඟින් අනුමත කර ඇති ස්ථානයක් වෙත යොමු කිරීම.
    පර්යේෂණ වාර්තාව භාෂා සංස්කරණය සඳහා විශ්ව විද්‍යාලය විසින් අනුමත ස්ථානයකට යොමු කිරීම.
05. අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය අතිරේක පොත් පත් සඟරා, ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම හා වෙනත් පර්යේෂණ පත්‍රිකා ආදිය අන්තර්ජාලය හරහා බාගත කිරීම සහ මුද්‍රිත පිටපත් ලබා ගැනීම.
06. විශ්ව විද්‍යාලය මඟින් පවත්වන අතිරේක වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා සහභාගි වීම.
07. අවසාන පර්යේෂණ වාර්තාව සකස් කිරීම (Binding of Thesis) සහ අවශ්‍ය පිටපත් සංඛ්‍යාව මුද්‍රණය කිරීම.
08. අවසන් නිබන්ධනයේ Plagiarism පරීක්ෂා කිරීම සඳහා මෘදුකාංගයක්ට යොමු කිරීම සඳහා වන වියදම්.

මෙම නිලධාරීන් 06 දෙනා දර්ශනශූරී පාඨමාලාව හැදෑරීම ලබා දුන් මාසික අධ්‍යයන දීමනාව 2016 ජනවාරි සිට ජාතික අධ්‍යාපන ආයතනයෙන් නොගෙවීම නිසා එම නිලධාරීන්ගේ දර්ශනශූරී පාඨමාලාවේ වියදම් පියවා ගැනීමට සහ පාඨමාලාව හැදෑරීමට එම නිලධාරීන්ට දැඩි දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවී ඇත.

මෙම නිලධාරීන්ගේ වෘත්තිය දියුණුව ආයතනයේ ඉදිරි කටයුතුවල සාර්ථකත්වයට බෙහෙවින් ඉවහල් වනු ඇත. එමනිසා මෙම මාසික අධ්‍යයන වියදම් දීමනාව 2016 ජනවාරි සිට ගෙවීමට ඔබතුමාගේ අනුමැතිය ලබා දෙන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි.

ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්

ජාතික අයවැය දෙපාර්තමේන්තුව
தேசிய வரவு செலவுத் திட்டத் திணைக்களம்
DEPARTMENT OF NATIONAL BUDGET
මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
பொதுத் திறைசேரி, நிதி அமைச்சு, கொழும்பு 01, இலங்கை.
General Treasury, Ministry of Finance, Colombo 01, Sri Lanka.
Web Site : www.treasury.gov.lk e-mail : budget@nbd.treasury.gov.lk

1049

මගේ අංකය / எனது இல. / My No. : BD/HRD/126/09/2016
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2016.11.21

ලැබුණා
2570
25 NOV 2016
අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

අධ්‍යක්ෂ ජනරාල්තුමියනි

<u>දර්ශණශූරී උපාධි පාඨමාලාව හදාරණ නිලධාරීන්ට මාසික අධ්‍යයන නිවාඩු දීමනාව ගෙවීමට අනුමැතිය ලබාගැනීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක **NIE/ERMV/FA/424/111** සහ 2016.08.09 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, පහත සඳහන් විස්තර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත මෙම දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව දන්වා යවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

1. ජාතික අධ්‍යාපන ආයතනයේ දර්ශණශූරී උපාධිය සඳහා අධ්‍යයන කටයුතු සිදුකරමින් සිටින නිලධාරීන් හට ඔවුනගේ සේවා ව්‍යවස්ථාවේ හෝ බඳවා ගැනීම් හා උසස් කිරීම් පටිපාටිය අනුව ඉදිරි උසස්වීම් සඳහා එවැනි උපාධියක් අවශ්‍ය වන්නේද

2. එවැනි අවශ්‍යතාවයක් ඇත්නම් උසස්කිරීම් පටිපාටිය හෝ වෙනත් අදාල ලියවිලිවල පිටපත්

මෙයට - විශ්වාසී

එස්.ඒ.බරගොඩ
අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

** Urgent
D/External Res. Mgt
Pl. prepare a letter and submit
25/11/16
DG



අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General : 0094-11-2484665, 0094-11-2484639(Fax)
කාර්යාලය / அலுவலகம் / Office : 0094-11-2484669, 0094-11-2484853
ෆැක්ස් අංකය / தொலைநகல் இல. : 0094-11-2484807

# ජාතික අධ්‍යාපන ආයතනය
# தேசிய கல்வி நிறுவகம்
# NATIONAL INSTITUTE OF EDUCATION

තැ.පෙ. 21, හයිලෙවල් පාර, මහරගම
த.பெ. 21, ஹைலெவல் வீதி, மகரகம
P.O. Box 21, High Level Road, Maharagama, Sri Lanka


අපේ යොමුව: / எமது கோவை: / Our Reference: NIE/ER/MU/FA/424/III

ඔබේ යොමුව: / தங்கள் கோவை: / Your Reference:

දිනය: / திகதி: / Date: 2016.12.08

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

**<u>දර්ශනශූරි උපාධි පාඨමාලාව හදාරන නිලධාරීන්ට මාසික අධ්‍යයන නිවාඩු දීමනාව ගෙවීමට අනුමැතිය ලබා ගැනීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගැනීම පිණිස මගේ සමාංක හා 2016.08.09 දිනැතිව ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද ලිපිය අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මා වෙත එවා ඇති අංක : BD/HRD/126/09/2016 හා 2016.11.21 දිනැති ලිපිය හා බැඳේ.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද නව බඳවා ගැනීම් / උසස්වීම් පටිපාටිය අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (අධ්‍යයන) තනතුරු සඳහා උසස් කිරීමේ දී සුදුසුකම් ලෙස ආචාර්ය උපාධියක් ලබා තිබිය යුතුය.

ජාතික අධ්‍යාපන ආයතනය විසින් නුදුරු අනාගතයේ දී දර්ශනශූරි (PhD) උපාධි පාඨමාලාව පැවැත්වීම සැලසුම් කර ඇති අතර දැනටමත් දර්ශනපති (Mphil), ශාස්ත්‍රපති (MA), විද්‍යාපති (MSc) උපාධි පාඨමාලා පැවැත්වීමට කටයුතු කරනු ලබයි. මෙම පාඨමාලා මෙහෙයවන අධ්‍යයන කාර්ය මණ්ඩලය අනිවාර්යයෙන්ම ආචාර්ය උපාධිධාරීන් වීම අත්‍යවශ්‍ය කරුණකි.

එබැවින් මෙම නිලධාරීන්ගේ වෘත්තිය දියුණුව ආයතනයේ ඉදිරි කටයුතුවල සාර්ථකත්වයට බෙහෙවින් ඉවහල් වන බැවින් මෙම මාසික අධ්‍යයන වියදම් දීමනාව 2016 ජනවාරි සිට ගෙවීමට අනුමැතිය ලබා දෙන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි.

පහත සඳහන් ලිපිවල පිටපත් මෙයට යා කර ඇත.

1. මගේ සමාංක හා 2016.08.09 දිනැති ලිපියේ පිටපතක්
2. ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද ලිපියේ පිටපතක්
